ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

# රණවිරුවා

2019 නොවැම්බර් • 211 කලාපය



## දිනූ රට සුරකින අභිමානය

දුන් රැකවරණ පරපුර රකිනු රිසියෙන
අන් කිසිවකුට නොමැතිය කිසිත් සමවන
සුන් කර දමා රුපුසෙන් එදා ජයගෙන
රන්වැට ඔබයි පින් බිම වටා ඉදිවුන

මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ



මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ.



# බුහුමන් ලැබූ විරුවන් නමට අභිමන් සෙවණක්.

ශ්‍රී ජයවර්ධනපුරයෙහි අභිනවයෙන් ඉදිකරන ලද යුද්ධ හමුදා මූලස්ථානය 2019 නොවැම්බර් මස 08 දිනට යෙදුනු සුබ මොහොතින් අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ සුරතින් විවෘත කෙරිණ. මහල් දහයකින් යුත් එහි නවීනතම ආරක්ෂක පද්ධතියක්, හෙලිකොප්ටර් ගොඩබැස්සවීමේ අංගන, සුබෝපභෝගී භෝජනාගාර, ආපනශාලා, කාර්යාල කාමර, වාහන නවතා තැබීමේ ඉඩපහසුකම් ඇතුලු අංග සම්පූර්ණ අතිනවීන පහසුකම්වලින් සමන්විතය. ශ්‍රී ලංකාවේ විශාලතම කාර්යාල ගොඩනැගිල්ල ලෙස සැලකෙන එහි 4000 කට ආසන්න පිරිසකට රාජකාරී කිරීමේ ඉඩකඩ පැවතීමද විශේෂත්වයකි.



යුද්ධ හමුදා මූලස්ථානය විවෘත කිරීම සංකේතවත් කරමින් ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුව මගින් මුද්දරයක් නිකුත් කිරීමද, ජනාධිපති පදක්කම් දෙකක් එළිදැක්වීමද එහිදී සිදුවූ වැදගත් ඓතිහාසික කටයුත්තකි. මෙම අවස්ථාවට මැති ඇමතිවරු, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, ත්‍රිවිධ හමුදාධිපතිවරු, ආරක්ෂක අංශ සාමාජිකයින් ඇතුලු සම්භාවනීය අමුත්තන් රැසක්ද එක්වූහ.

රණකාමී විරුවන් සපිරි ශ්‍රී ලංකා යුද හමුදාවට මෙවන් වූ අභිමානවත් සෙවණක් හිමිවීම යුද්ධ හමුදාව ලැබූ ඉමහත් ගෞරවයක් සේ සැලකිය හැකිය.








# විදු බිමේ විරු පුතුට හදවතින් හරසර...







මාතලේ ශාන්ත තෝමස් විද්‍යාලයෙන් අධ්‍යාපනය හදාරා එම විද්‍යාලයට ඉමහත් කීර්තියක් අත්කර දෙමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපති ධූරයට පත්වූ ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී වෙත උපහාර පිදීම වෙනුවෙන් සංවිධානය කෙරුණු අභිමානවත් උත්සවයක් ඉකුත් නොවැම්බර් මස 01 දින එම විද්‍යාලයේදී පැවැත්විණ.

ශාන්ත තෝමස් විද්‍යාලයේ විදුහල්පති, ගුරු භවතුන් හා සිසුන්, එම විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමය, මාතලේ ව්‍යාපාරිකයින්ගේ සංගමය මෙන්ම ප්‍රධාන පෙළේ සමාජ ක්‍රියාකාරීන් විද්වතුන් රැසක් ඒකාබද්ධව සිදුකළ මෙම උපහාර පිරිනැමීම ඓතිහාසික මාතලේ පුරවරයටද අභිමානයක් ගෙන දුන් අවස්ථාවක් විය.

එහිදී රථ පෙලපාලියකින් විද්‍යාල භූමිය කරා කැඳවාගෙන ආ යුද්ධ හමුදාධිපතිතුමන් එම විද්‍යාලයේ ශිෂ්‍යභට කණ්ඩායම විසින් මහත් හරසරින් පිළිගනු ලැබීය. අනතුරුව එම ප්‍රදේශයෙන් බිහිව සමස්ත දිවයිනේම නමක් තැබූ දක්ෂ හොකී ක්‍රීඩකයෙකු වෙනුවෙන් ඉදිකෙරෙන ස්මාරකයක් වෙනුවෙන් මුල්ගල තැබීමද යුද්ධ හමුදාධිපතිතුමාගේ සුරතින් සිදුවිය. තවද විද්‍යාලයේ විදුහල්පතිතුමන්ගේ ඉල්ලීමකට අනුව යුද හමුදාව ලවා ප්‍රතිසංස්කරණය කරවන ලද විද්‍යාලයීය ක්‍රීඩාපිටියේ සමරුඵලකය නිරාවරණය කර සිසුන් වෙත භාරදීමද යුද්ධ හමුදාධිපතිතුමා අතින් සිදුකෙරිණ. "විද්‍යාලය සමඟ මා කටයුතු කළ ආකාරය සිහිපත් කිරීම අමරණීය වන අතර වැඩෙන තරුණ තරුණියන්ට නව මඟකට යොමුවීමට එය උපකාරී වනු ඇත. මගේ පාසල් කාලය තුළ ක්‍රිකට් කණ්ඩායමේ නායකයා, සංගීත කණ්ඩායමේ නායකයා, ප්‍රධාන ශිෂ්‍ය නායකයා සහ ශිෂ්‍යභට කණ්ඩායමේ සැරයන්වරයා වීමේ වරප්‍රසාදය මට ලැබුණා. එය මා අද සිටින තත්ත්වයට පත්වීමට හේතු වූ බව මම තරයේ විශ්වාස කරමි." යනුවෙන් යුද්ධ හමුදාධිපතිතුමා උපහාර උත්සවයේදී සිසුන් අමතා ප්‍රකාශ කරන ලදී.



# අභිමන් සෙවණක ගෞරවණීය ඇරඹුමක්...







ශ්‍රී ජයවර්ධනපුර නව යුද්ධ හමුදා මූලස්ථාන සංකීර්ණයේ පිහිටි යුද්ධ හමුදාධිපති කාර්යාලයේ වැඩ ආරම්භ කිරීම ඉකුත් නොවැම්බර් මස 14 දිනට යෙදුණු සුබ මොහොතින් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී විසින් චාරිත්‍රානුකූලව සිදුකරන ලදී. ඒ නිමිත්තෙන් ආගමික වතාවත්වලට මුල් තැන දෙමින් එම මූලස්ථාන පරිශ්‍රයේ පැවති අභිමානවත් උත්සවයේ විශේෂ මතක සටහන් මෙහි දැක්වේ.



# ක්‍රීඩා තරු අගයන රාත්‍රිය





පසුගිය වර්ෂයන්හි ජාතික හා ජාත්‍යන්තර, මට්ටමේ මළල ක්‍රීඩා ඉසව් නියෝජනය කරමින් ජයග්‍රහණ ලැබූ යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුවේ ක්‍රීඩකයින් ඇගයීම සඳහා පවත්වනු ලැබූ "වර්ණ රාත්‍රිය (Craftsman's Colours Night)" ඉකුත් ඔක්තෝබර් 28 දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විණ. එම අවස්ථාවට ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් එම්ජ්ජ්ඩී සිරිනාග ගේ ආරාධනයෙන් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ප්‍රධාන අමුත්තා ලෙස සහභාගි විය.



මෙම සම්මාන ප්‍රධානෝත්සවයේ පළමු අධියර වශයෙන් මෝටර් රථ, ටෙනිස්, මළල ක්‍රීඩා, බේස්බෝල්, කබඩි හා ජූඩෝ තරඟවලින් විශිෂ්ට දක්ෂතා දැක්වූ ක්‍රීඩකයින් හා උපදේශකයින්ට වර්ණ ප්‍රදාන කෙරිණ. තවද පසුගිය 2012 සිට 2018 දක්වා වූ කාලය තුළ දක්ෂතා දැක්වූ හොඳම ක්‍රීඩකයින් හට "ගෝල්ඩන් හෝස් (Golden Horse)" සම්මානය ප්‍රදානය කිරීමටද යුද්ධ හමුදාධිපති එක්විය. එම සම්මාන ප්‍රධානෝත්සවයේදී කරාටේ, කැරම්, බර ඉසිලීම, බේස් බෝල්, රගර්, පා පන්දු, බොක්සිං, චෙස්, බැඩ්මින්ටන්, ඔරු පැදීම, ස්කොෂ්, කඹ ඇදීම, පිහුණුම් යන ක්‍රීඩා ඉසව්වන්හි ජයග්‍රාහකයන්ටද සම්මාන ප්‍රදානය කෙරිණ.





# විරු හිසට සෙවණක් දරුවනට සරණක්

ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ වීරෝධාර රණවිරුවන්ට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ට නව නිවාස ඉදිකරගැනීම සඳහා මූල්‍යාධාර පිරිනැමීමේ උත්සවයක් ඉකුත් නොවැම්බර් 31 දින කුරුණෑගල හෙරලියාවල ස්ථාපිත එම රෙජිමේන්තු මූලස්ථාන බලඇණි පරිශ්‍රයේදී පැවැත්විණ. එහිදී එම රෙජිමේන්තු සාමාජිකයින්ගේ හා සිවිල් සේවකයින්ගේ පවුල්වල අ.පො.ස උසස් පෙළ අධ්‍යාපනය හදාරන සිසුන් 32 ක් සඳහා මසකට රුපියල් 3000 බැගින් වූ ශිෂ්‍යත්ව ප්‍රදානයක්ද සිදුකෙරිණ. ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළු රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඩීජ්ආර් රණවක ආර්එස්පී එන්ඩීයූ අයිජී ගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක කළ එම මාහැඟි කටයුත්තට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහ යුද්ධ හමුදා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිණිය සුජීවා නෙල්සන් මහත්මිය සහභාගි වූහ.





එහිදී නිවාස ඉදිකිරීම වෙනුවෙන් රුපියල් මිලියන 30 කට ආසන්න අති දැවැන්ත මුදල් සම්භාරයක් ප්‍රදානය කරන ලද අතර, එය එම රෙජිමේන්තු ඉතිහාසයේ මෙතෙක් පිරිනැමූ ඉහලම මුදල ද වේ. මෙම කටයුත්ත සඳහා අරමුදල් සම්පාදනය ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව වාර්ෂිකව පවත්වනු ලබන "ගාඩියන්ස් මේලා" දැවැන්ත සැණකෙළිය තුළින් සපයා ගැනීම විශේෂත්වයකි.





# විවාහක නිවාස සංකීර්ණය විවෘත කෙරේ

අගනුවර හා එහි තදාසන්න ප්‍රදේශවල සේවය කරන විවාහක නිලධාරීන් සහ සෙසුනිලයින් සඳහා නවාතැන් සැපයීමේ අරමුණින් ඉඩම්, දේපළ හා හටනිවාස අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් ප්‍රතිසංස්කරණය කරන ලද නාරාහේන්පිට පාර්ක් පෙදෙසේ පිහිටි මහල් 4 කින් සමන්විත ඇන්ඩර්සන් විවාහක නිවාස සංකීර්ණයේ නිවාස 16 ක් ඉකුත් නොවැම්බර් මස 15 දින යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී විසින් විවෘත කරන ලදී.



එහිදී මෙම අද්විතීය ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට දායකත්වය ලබාදුන් යුද්ධ හමුදා සාමාජිකයින් 137 දෙනෙකු වෙත ඇගයීම් සහතික පත් ප්‍රදානය කිරීමද යුද්ධ හමුදාධිපති තුමා අතින් සිදුවිය. තවද ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ NVQ 3 මට්ටමේ සහතිකය සඳහා සුදුසුකම් ලැබීමටද එම යුද්ධ හමුදා සාමාජිකයින්ට පහසුකම් සපයන බවට යුද්ධ හමුදාධිපතිතුමන් එහිදී පොරොන්දු විය.



මෙම අවස්ථාව සඳහා විධායක ජෙනරල් මේජර් ජෙනරාල් ඩබ්ලිව්ජ්එන්එම් වීරසිංහ ආර්එස්පී යූඑස්පී එන්ඩීසී, ඉඩම් හා දේපල හඨ නිවාස අධ්‍යක්‍ෂ ජෙනරාල් මේජර් ජෙනරාල් සීඑම්ඩීපී චන්ද්‍රසේකර එන්ඩීයූ, යුද්ධ හමුදා පුහුණු අධ්‍යක්‍ෂ ජෙනරාල් මේජර් ජෙනරාල් ටීඑස් බන්සජායා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ, ජනමාධ්‍ය අධ්‍යක්‍ෂ ජෙනරාල් මේජර් ජෙනරාල් ජ්එම්ජ්එස්බී අතපත්තු ඇතුලු ජ්‍යෙෂ්ඨ නිලධාරීහු එක්ව සිටියහ.



# නව ආරක්ෂක ලේකම් හමුවී...



යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ඉකුත් නොවැම්බර් 03 දින ආරක්ෂක අමාත්‍යංශයේදී ආරක්ෂක ලේකම් (විශ්‍රාමික) මේජර් ජෙනරාල් කමල් ගුණරත්න මහතා හමුවී සුහද සාකච්ඡාවක නිරත වූයේය. නව ආරක්ෂක අමාත්‍යංශ ලේකම් පත්වීමෙන් අනතුරුව ප්‍රථම වරට එතුමන්ව හමුවූ ආරක්ෂක අංශ ප්‍රධානීන් අතර යුද්ධ හමුදාධිපති ද විය. එම හමුව අවසානයේ දෙදෙනා අතර සමරු තිළිණ හුවමාරුවක් ද සිදුකෙරිණ.

---

# නයිජීරියානු යුද්ධ හමුදා නියෝජිත හමුවක්...





ශ්‍රී ලංකා යුද්ධ හමුදා විශේෂ බලකායේ සවිස්තරාත්මක පුහුණු වැඩසටහනක් පිළිබඳ වැඩිදුර අධ්‍යයනය කිරීමට නයිජීරියානු යුද්ධ හමුදාවේ පරිපාලන අධ්‍යක්ෂ මේජර් ජෙනරාල් ජී. ඔයිෆෙසෝබි (Major General G Oyefesobi) ගේ ප්‍රධානත්වයෙන් හය දෙනෙකුගෙන් සමන්විත නියෝජිත කණ්ඩායමක් දින පහක සංචාරයක් සඳහා ඉකුත් ඔක්තෝම්බර් 28 දින දිවයිනට පැමිණෙන ලදී. එහිදී එම නියෝජිත කණ්ඩායම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ද හමුවී සුහද කතාබහක නිරත වූහ.

එම සුහද හමුව අවසානයේ යුද්ධ හමුදාධිපති සහ නයිජීරියානු යුද්ධ හමුදාවේ පරිපාලන අධක්ෂ අතර සුහදත්වය හා අවබෝධය තවදුරටත් ශක්තිමත් කරමින් සමරු තිළිණ හුවමාරුවක්ද සිදුවිය. තවද, මෙම අවස්ථාව සඳහා යුද්ධ හමුදා පුහුණු අධ්‍යක්ෂක ජෙනරාල් මේජර් ජෙනරාල් ටීඑස් බන්සජායා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යුඑස්පී එන්ඩීයූ ද සහභාගී විය.

# යුද්ධ හමුදා පැසිපන්දු කණ්ඩායමට දිරිදෙමින්



නේපාලයේ, කත්මණ්ඩු නුවර පැවැත්වීමට නියමිත දකුණු ආසියා පැරා මළල ක්‍රීඩා තරඟාවලියට සහභාගීවීමට නියමිත යුද්ධ හමුදා පැසිපන්දු ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඉකුත් නොවැම්බර් 26 දින යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී හමුවූහ. එහිදී සාමූහික හැඟීමෙන් ක්‍රීඩාකොට මව්බිමට කීර්තියක් අත්කර දීම උදෙසා ඔවුන්ව දිරිමත්කළ යුද්ධ හමුදාධිපතිතුමන් එම ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙත සමරු තිලිණ ප්‍රදානයක්ද සිදුකරන ලදී. මෙම අවස්ථාව උදාකරදීම වෙනුවෙන් එම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ද යුද්ධ හමුදාධිපතිතුමන් වෙත සිය ස්තුතිය පුදකළහ.

මෙම අවස්ථාවට යුද්ධ හමුදා පැසිපන්දු කමිටුවේ සභාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ආර්පී ද සිල්වා යූඑස්පී එන්ඩීයූ අයිජී සහ යුද්ධ හමුදා පැසිපන්දු කමිටුවේ ලේකම් ද සහභාගි වූහ.

---

## රෙජිමේන්තු අධිපතිගේ ඒකක සංචාරය...

ගැමුණු හේවා රෙජිමේන්තු අධිපති ලෙස පසුගියදා වැඩභාරගත් මේජර් ජෙනරාල් ටීඑස් බන්සජායා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ ඉකුත් නොවැම්බර් 18 දින එම රෙජිමේන්තුවට අයත් ඒකකවල සංචාරයක නිරතවිය. යුද්ධ හමුදා ප්‍රධාන මාණ්ඩලික ශාඛාවේ අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික ලෙස ද කටයුතු කරන හෙතෙම සිය සංචාරය තුළදී 1, 3, 8, 14, 18 හා රෙජිමේන්තු මූලස්ථාන බළඇණියෙහි රාජකාරී ස්වභාවය හා ඒකක භට පිරිස්වල පාලන අවශ්‍යතා පිළිබඳ සොයාබැලීය. එමෙන්ම මෙම අවස්ථාව සඳහා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් ඒඑ්ඩීඑන්එස්පී දුණුවිල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී මෙන්ම රෙජිමේන්තු අංශ හා ආයතන නියෝජනය කරමින් නිලධාරීන් සහ රෙජිමේන්තු සැරයන් මේජර් ද සහභාගි වූහ.





# රණවිරු පවුලකට හිසට සෙවණක්....





රටදැය වෙනුවෙන් දිවිපිදූ 2(සෙව්) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු ඒකකයට අයත් සෙ/2සී00540 සැරයන් බණ්ඩාර කේජ්එස්වී රණවිරුවා වෙනුවෙන් ඉදිකළ නව නිවසක් ඉකුත් නොවැම්බර් මස 01 දින එළැඹි සුබ මොහොතින් එම රණවිරුවාගේ බිරිඳ සහ දියණිය වෙත පරිත්‍යාග කෙරිණ. සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ පූර්ණ දායකත්වය මත එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේ අධීක්ෂණය යටතේ ඉදිකරන ලද මෙම නිවස සඳහා රුපියල් මිලියන 1.5 කට ආසන්න මුදලක් වැය කොට ඇත. අදාළ නිවස හිමිකරුවන් වෙත භාරදීම යුද හමුදා සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිණී සුජීවා නෙල්සන් මහත්මියගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරුණු අතර, එම අවස්ථාවට සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිණිය කේෂාණී හෙට්ටිආරච්චි මහත්මිය ඇතුලු එහි සාමාජිකාවන් පිරිසක්ද සහභාගි වූහ.

# රණක්ෂිතයට පත් විරුවන් හමුවී

ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බළකා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් විසින් ඉකුත් නොවැම්බර් 22 දින මිහිඳු සෙත් මැදුරේ නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගීන්ගේ සුවදුක් සොයාබැලීමේ නිරීක්ෂණ චාරිකාවක නිරත විය. එම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තිය වශයෙන් යුද හමුදා සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිණිය සුජීවා නෙල්සන් මහත්මිය සහභාගී වූවාය. එහිදී සභාපතිණිය රණවිරුවන්ගේ සුවදුක් සොයා බලමින් ඔවුන් වෙත ත්‍යාග පාර්සල්ද පරිත්‍යාග කරන ලදී. නේවාසික රණවිරුවන් වෙත IWMS හි ඉංග්‍රීසි භාෂාව ප්‍රගුණ කිරීමේ පාඨමාලාවක්ද හඳුන්වා දුන් අතර, සේවා බළකා රණවිරුවන්ගේ 2019 වර්ෂයේ 5 වසර ශිෂ්‍යත්වය සමත් දූදරුවන් හට මෙන්ම 2018 වර්ෂයේ අ.පො.ස(සා/පෙළ) සමත් දුවාදරුවන් හට ත්‍යාග බෙදාදීමටද ගරු සභාපතිණිය එක්විය. මෙම උත්සව අවස්ථාවට සේවා බළකා සේවා වනිතා ශාඛාවේ සභාපතිණිය මනෝරි කල්දේරා මහත්මිය ඇතුලු ජ්‍යෙෂ්ඨ සාමාජිකාවෝ රැසක්ද එක්වූහ.





# කළා කුසලතා එළිදක්වමින්....







යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය මගින් රණවිරුවන්ගේ සුබසාධනය උදෙසා දිවයිනේ විවිධ ප්‍රදේශවල ඔවුන්ගේ දූවාදරුවන් වෙනුවෙන් පෙර පාසල් හා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පවත්වාගෙන යනු ලබයි. එම පෙර පාසල් හා දිවා සුරැකුම් මධ්‍යස්ථාන අතුරින් මැනිංටවුන් විරු කැකුළු පෙරපාසලේ දරු දැරියන් විසින් ඉදිරිපත් කළ වර්ෂ අවසාන කලා කුසලතාවයන් එළිදැක්වීමේ විවිධ ප්‍රසංගය ඉකුත් නොවැම්බර් 07 දින කොළඹ ආරක්ෂක විද්‍යාලීය ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.

එම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තිය ලෙස යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිණිය සුජීවා නෙල්සන් මහත්මිය සහභාගී වූවාය. එහිදී කුඩා දරු දැරියන් කැපවීමෙන් පුහුණුවීම් සිදුකර උසස් අන්දමේ නිර්මාණ ප්‍රසංගයක් ඉදිරිපත් කිරීම එහි පැමිණි සැමගේ ප්‍රශංසාවට බඳුන් විය.

# පාබල හමුදා සේවා වනිතා ශාඛාව





පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිණිය ක්‍රිෂානි මුදලිගේ මහත්මියගේ උපදෙස් හා මගපෙන්වීම මත එම රෙජිමේන්තුවට අයත් මියගිය, විශ්‍රාමික සහ දැනට සේවයේ නියුතු නිලධාරීන්ගේ බිරින්දෑවරුන් වෙනුවෙන් වූ සුහද හමුවක් ඉකුත් ඔක්තෝම්බර් 20 එම රෙජිමේන්තු නිලධාරී නිවස්නයේදී පවත්වන ලදී. එම අවස්ථාව සඳහා ශ්‍රී ලංකා පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ හිටපු සභාපතිණියන්ද සහභාගී වූ අතර, ඔවුන්ගේ වටිනා සේවය ඇගයීමක් ලෙස එහිදී සමරු තිළිණ ප්‍රදානයක්ද සිදුකරන ලදී.

## සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව





සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිණිය ශිරෝමී මාසකෝරල මහත්මියගේ ධූර කාලය අවසන්වීම නිමිත්තෙන් සංවිධානය කෙරුණු සුහද හමුවක් ඉකුත් ඔක්තෝම්බර් 23 දින එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ. එහිදී එතුමියගේ ධූර කාලය තුළ සිදුකරනු ලැබූ සේවාවන් වෙනුවෙන් සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව විසින් හා "යන්ග් කුගර්ස්" ළමා සමාජය විසින් ඇය වෙත සමරු තිලිණ ප්‍රදානයක්ද සිදුකරන ලදී.

## ඉංජිනේරු සේවා බළකා සේවා වනිතා ශාඛාව







6(සේවි) ඉංජිනේරු සේවා රෙජිමේන්තුව යටතේ රාජකාරී කරනු ලබන සෙ/6එස්00949 ඉසෙ ජයලත් එච්එස් යන සෙනිගේ ශ්‍රවණාබාදයකින් පෙළෙන දියණියන් දෙදෙනා වෙනුවෙන් එම සේවා බළකා සේවා වනිතා ශාඛාව වෙතින් රු. 160,000.00 ක මුදලක් වැයදරා ශ්‍රවණ උපකරණ කට්ටල 02 ක් පරිත්‍යාග කෙරිණ. සේවා වනිතා ශාඛාවේ උප සභාපතිණිය වන දීපිකා ප්‍රසන්ති චන්ද්‍රසේන මහත්මියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ඔක්තෝම්බර් 24 දින එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී අදාල ශ්‍රවණ උපකරණ කට්ටලය එම දරුවන් වෙත ප්‍රදානය කරන ලදී.

## පොලිස් හේවා බළකා සේවා වනිතා ශාඛාව



ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බළකා සේවා වනිතා ශාඛාව වෙතින් සංවිධානය කරනු ලබන මාසික වැඩසටහන් මාලාවට අනුව 3 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බළකායේ අනුග්‍රාහකත්වය මත ඩීම්රෝන් ආයතනයේ සහයෝගය ලබාගනිමින් රූපලාවන්‍ය හා කොන්ඩා සැකසීම පිළිබඳ එක්දින වැඩමුලුවක් ඉකුත් ඔක්තෝම්බර් 05 දින පොලිස් හේවා බළකා රෙජිමේන්තු මූලස්ථානයේ කොනොනි සමාජ ශාලාවේදී පැවැත්විණ. ඒ සඳහා සේවා වනිතා සභාපතිණිය ඇතුලු රණවිරු බිරින්දෑවරුන් හා රණවිරුවන් 150 දෙනෙකු සහභාගි වූහ.

# Be Happy Why Worry?



*Some people have unrealistic goals and pursue them thereby losing many other important things and occasions that make them happy. Some have lots of undue expectations in life and behave as if they live for 1000 years.*

ware all born happy. Look at a baby giggling or a child playing. That is proof enough to say that happiness is our birth right and we should all be naturally happy and content. But just look at the world or watch a newscast and we will realize that the world has lost its natural flair to be happy. Somewhere in the process of our growing up, most of us tend to lead a discontented life. People who have a low self-esteem, who consistently view themselves and the world with the eyes of pessimism are most prone to be unhappy. Life is very short and uncertain. We never know at what point in our lives, the death would snatch us. Unfortunately, instead of being happy in this short span of life, due to various petty reasons, we lead unhappy lives despite the fact that we have many reasons and things around us to be happy.

There are various factors like behavioral, psychological, socio-economic and personal for people to be unhappy. The first factor is hate. In this life everything does not go our way. We cannot always be with the people or things we like. Sometimes you hate people in your workplace, your boss or subordinates or person sitting next to you in a bus or train. Often you are unhappy about your room partner or co-worker. Most of the time strong hatred towards somebody leads to an enmity, a negative psychological condition that makes you unhappy. So, it is important to control and practice your mind not to hate somebody or something too much. If not, you will continue to be unhappy almost all the time in your life.

The next thing that affects people's happiness is fear and worry. It is true that fear and worry seem to be part and parcel of human life. Why do people worry and what do they worry about? Worries begin in the minds of people when they compare themselves with others and feel inadequate. Many of us think that "I am not good enough to do that job, or I do not think I am clever enough to make an impact." They may be afraid to behave naturally in the presence of others. So, they behave in the way people want them to behave, not as they are. This creates a friction between their inner and outer selves and worry and suffering follow. Some people live in fear about their future or things going to befall on them in the future. Some people worry and fear about diseases that they may get in the future. But if you logically think, these are circumstances that you cannot control. Your mind could be better practiced to face the life as it comes and not to worry too much about the things which you cannot control.

Some people have unrealistic goals and pursue them thereby losing many other important things and occasions that make them happy. Some have lots of undue expectations in life and behave as if they live for 1000 years. Too much expectations and unachievable goals you set for you, invariably deprive you from having quality time with your family, friends and loved ones and even spoil your leisure and composure. Often this attitude might make you to be a prisoner in your own soul distancing you from your normal self, making not only you but even dear and near people around you unhappy. Having too many unrealistic goals in life is a syndrome and it might lead to depression, a negative physiological condition. Depression has become increasingly widespread and has become a major cause of unhappiness today.

It is true that modern life is a struggle - a struggle to gain monetary rewards, comfort and luxury. Instead of bringing happiness, this lifestyle brings anxieties and stress. There are decisive moments in everyone's life. All material things are of little value when compared to the mental or spiritual joy of being detached from worldly things. If you logically think, "happiness is not what you possess. But what you are." The recipe for happiness is simple. Happiness is a state of mind. It cannot be found in the material things such as wealth and power or fame. Where can we look for happiness? "Within you" says Lord Buddha. So, without delay guard your mind from unwanted thoughts and practice your mind to look at things rationally. Then you will be able to lead a happy and contented life without worries, sufferings and agonies of modern life.

***Brigadier Keerthi Kottawattha***
*Deputy Commandant -*
*Sri Lanka Military Academy*

# නිවේදන කෞශල්‍යය ඔප් නංවමින්....





යාපනය බලප්‍රදේශයේ රාජකාරී නියුතු සෙබළ සෙබළියන්ගේ නිවේදන කුසලතාවය වර්ධනය කිරීමේ අරමුණින් එම ආරක්ෂක සේනා මූලස්ථානයේ පූර්ණ අධීක්ෂණයෙන් සංවිධානය කළ හොඳම නිවේදකයා සහ නිවේදිකාව තේරීමේ තරගාවලියක් පසුගියදා පැවැත්විණ. තෝරාගත් සෙබළ සෙබළියන් 24 දෙනෙකු තරග වැදුනු එහි අවසන් මහා තරගය ඉකුත් ඔක්තෝම්බර් 30 දින පැවති අතර, ඉන් ප්‍රථම ස්ථානය 3 ශ්‍රී ලංකා සංඥා බළකායට අයත් සෙ/279223 මා/සැරයන් සෙනරත් ආර්පීඅයි හිමිකරගන්නා ලදී. එහි දෙවන ස්ථානය 4(සෙව්) ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බළකායට අයත් සෙ/ආර්101303 කාසෙ දර්ශිකා ජේ විසින් දිනාගත් අතර, එහි තෙවන ස්ථානය 7 ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බළකායට අයත් සෙ/725023 බනි 11 වසන්ති ඩීජීඑස් දිනාගන්නා ලදී. අදාළ ජයග්‍රාහක ජයග්‍රාහිකාවන් සඳහා වූ ජයසංකේත ප්‍රදානය යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී අතින් සිදුකෙරිණ. යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් පීආර් වනිගසූරිය වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී යූඑස්ඒසීජීඑස්සී ගේ අදහසකට අනුව ක්‍රියාත්මක වූ මෙම වැඩසටහන 51, 52, 53 සේනාංක හා ඒ යටතේ පාලනය වන බළසේනා මූලස්ථාන විසින් සංවිධානය කරන ලදී.

---

## නිලධාරීන් වෙනුවෙන් දැනුම මිනුම තරගාවලියක්....

යාපනය බලප්‍රදේශයේ රාජකාරී නියුතු නිලධාරීන්ගේ දැනුම වර්ධනය උදෙසා බළඇණි 26 ක සහභාගීත්වයෙන් දෙවෙනි වරට සංවිධානය කළ අන්තර් ඒකක දැනුම මිනුම තරගාවලියක් පසුගියදා පැවැත්විණ. එහි ශූරතාවය 10 වන ශ්‍රී ලංකා ඉංජිනේරු රෙජිමේන්තු කණ්ඩායම විසින් දිනාගත් අතර අනුශූරතාවය හිමිවූයේ 1 වන විජයබාහු පාබල රෙජිමේන්තු කණ්ඩායමටය. තරගාවලියේ දක්ෂතම තරගකරුවා ලෙස 10 වන ඉංජිනේරු රෙජිමේන්තු කණ්ඩායමේ මේජර් තිවංක කන්නංගර සම්මානය හිමිකරගන්නා ලදී. ඉකුත් නොවැම්බර් 04 දින පැවති අවසන් තරගයේ ජය සංකේත ප්‍රදානෝත්සවය සඳහා යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ප්‍රධාන අමුත්තා ලෙස සහභාගි විය. තවද මෙම අවස්ථාවට යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් පීආර් වනිගසූරිය වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී යූඑස්ඒසීජීඑස්සී මෙන්ම සේනාංකාධිපතිවරු, බළසේනාධිපතිවරු ඇතුලු නිලධාරීන් හා සෙසුනිලයින් විශාල පිරිසක් සහභාගී වූහ.





# අන්තර් සේනාංක දැනුම මිනුම තරඟාවලිය - 2019....





ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් එච්ජේඑස් ගුණවර්ධන ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ උපදෙස් හා මඟපෙන්වීම යටතේ එම මූලස්ථාන බලප්‍රදේශයේ ස්ථාපිත සේනාංක, ඉදිරි නඩත්තු පෙදෙස (උතුරු මැද), බළසේනා සහ ඒකකයන්හි රාජකාරී නියුතු නිලධාරීන්ගේ දැනුම වර්ධනය කිරීමේ අරමුණින් යුතුව අන්තර් සේනාංක දැනුම මිනුම තරඟාවලියක් ආරම්භ කරන ලදී. ඉදිරි නඩත්තු පෙදෙස (උතුරු මැද) ආඥාපති මේජර් ජෙනරාල් කේඑම්ආර්පී කරුණාතිලක පීඑස්සී ගේ පූර්ණ අධීක්ෂණයෙන් පැවති එම තරඟාවලියේ අර්ධ අවසන් වටය ඉකුත් නොවැම්බර් මස 14 දින ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) නිලධාරී නිවස්න ත්‍රිමාන ශාලාවේදී පවත්වන ලදී. එහිදී ඉතා සාර්ථක ලෙස පිළිතුරු දුන් 03 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බළකා කණ්ඩායම 2 වන යාන්ත්‍රික පාබල රෙජිමේන්තු කණ්ඩායම පරදා තරඟාවලියේ පළමු ස්ථානය හිමිකර ගන්නා ලදී. මෙම තරඟාවලියේ අවසන් අවස්ථාව සඳහා ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) ආඥාපති ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස එක්වූ අතර, සේනාංකාධිපතිවරු, බළසේනාධිපතිවරු, ඒකක අණදෙන නිලධාරීන් සහ සෙසුනිලයින් විශාල පිරිසක් ද සහභාගී වූහ.

# සූපවේදී වැඩමුළුවක්....

ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) ආඥාපති ගේ සංකල්පයකට අනුව එම ආරක්ෂක සේනා මූලස්ථානය යටතේ රාජකාරී නියුතු භට පිරිස් අතරින් සූපවේදී රාජකාරී ඉටුකරනු ලබන අයවලුන් හට ගුණාත්මක හා ප්‍රනීතව ආහාර සකස් කිරීම සබැඳිව දැනුම වර්ධනය කිරීම සඳහා පවත්වන ලද වැඩමුළුවක් ඉකුත් ඔක්තෝබර් මස 25, 26 හා 27 යන තෙදින තුළ ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී. එම තෙදින වැඩමුළුව මෙහෙයවීම ගල්කිස්ස මහ හෝටලයේ සූපවේදී අධ්‍යක්ෂක දේශබන්දු ආචාර්ය ටී පබ්ලිස් සිල්වා මහතාගේ ප්‍රධානත්වයෙන් සිදුකරන ලදී.

මෙම වැඩමුළුව තුළදී ප්‍රධාන වශයෙන් දේශීය ආහාර විවිධ ක්‍රමවලට ගුණාත්මකව හා රසවත් ආකාරයට සකස්කිරීම සබැඳිව දැනුම වර්ධනය කිරීම සඳහා න්‍යායාත්මකව හා ප්‍රායෝගිකව පුහුණුවක් ලබාදෙන ලදී. මේ සඳහා ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) යටතේ රාජකාරී නියුතු 21, 54, 56, 61, 62 සේනාංක, ඉදිරි නඩත්තු පෙදෙස, බළසේනා මූලස්ථානයන්හි හා ඒකකයන්හි සූපවේදී රාජකාරී කරනු ලබන භට පිරිස් 242 ක් සහභාගි වූහ.

මෙම වැඩමුළුව අවසානයේ එය සාර්ථකව හදාරන ලද සූපවේදීන් සඳහා සහතික පත්‍ර බෙදාදීමටද කටයුතු කෙරිණ. මෙම වැඩමුළුව 212 බළසේනාවේ බළසේනාධිපති කර්නල් පීජ්එම් පීරිස් ආර්එස්පී යූඑස්පී පීඑස්සී සම්බන්ධීකරණයෙන් පැවති අතර, මෙම අවස්ථාවට ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් එච්ජේඑස් ගුණවර්ධන ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, දේශබන්දු ආචාර්ය ටී පබ්ලිස් සිල්වා ගේ මැතිණිය, සේනාංකාධිපතිවරු, බළසේනාධිපතිවරු ඇතුලු නිලධාරීන් සහ සෙසුනිලයින් විශාල පිරිසක් සහභාගි වූහ.





# සංචාරයක නිරතවෙමින්....

ආරක්ෂක සේනා මූලස්ථාන (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් එච්ආර්එන් ප්‍රනාන්දු ආර්එස්පී එන්ඩීසී ඉකුත් ඔක්තෝම්බර් 24 දින 22 සේනාංකය යටතේ ඇති 221, 222 හා 224 බළසේනාවන්හි සිය ප්‍රථම නිල සංචාරය සිදුකළ අතර, එහිදී හෙතෙම එම ප්‍රදේශයන්හි ප්‍රධාන රාජ්‍ය නිලධාරීන් සහ සියලුම ආගමික පූජකවරුන් ද හමුවිය.

22 සේනාංකය වෙතින් එහිදී ආඥාපති වෙත හමුදා සම්ප්‍රදායානුකූල කෘතවේදී සම්මාන මුරයක් ද පිළිගැන්වීය. රුක් රෝපණ වැඩසටහනකට හා සියලු නිල තේ පැන් සංග්‍රහයකට ද සහභාගි වූ ආඥාපතිතුමන් එහි සියලු භට පිරිස් ඇමතීමටද අමතක නොකළේය.

එම දෙදින සංචාරය අතරතුර ආඥාපති විසින් ත්‍රිකුණාමලය කෝනේෂ්වරම් කෝවිලේ පැවති විශේෂ පූජාවකටද සහභාගි විය.






## සිවිල් වැසියන් වෙත තවත් උපකාරයක්....





පැවති අයහපත් කාලගුණය සමග ඇදහැලුණු ධාරාණිපාත වර්ෂාව හේතුවෙන් අම්පාර, ලාහුගල ප්‍රදේශයේ ඇතිවූ හදිසි ගංවතුර තත්ත්වය මත එහි ගමනාගමන කටයුතු සම්පූර්ණයෙන්ම පාහේ අඩාල විය. එහිදී 24 සේනාංකයට අයත් 242 බළසේනා ප්‍රදේශයේ ස්ථානගත 24 ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු භට පිරිස් මැදිහත්ව යුද්ධ හමුදා යුනිබෆල් රථයක් යොදාගනිමින් පැය කිහිපයක් තුළ අවතැන්වූ සිවිල් වැසියන් මුදවාගැනීමට සමත්වූහ. නැගෙනහිර ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එච්ආර්එන් ප්‍රනාන්දු ආර්එස්පී එන්ඩීසී ද එම ප්‍රදේශයේ සංචාරය කරමින් ගංවතුර මට්ටම ඉහළ යාම හේතුවෙන් අවතැන්වූ සිවිල් වැසියන්ට ආරක්ෂාව සහ ප්‍රවාහන පහසුකම් සැපයීම සම්බන්ධව 24 සේනාංකයේ සේනාංකාධිපති වෙත උපදෙස් ලබාදෙන ලදී.

# ආගමික කටයුතුවලට මුල්තැන දෙමින්....





මාන්කුලම් ශ්‍රී සුගත විහාරයෙහි වාර්ෂික කඨින පූජෝත්සවය ඉකුත් ඔක්තෝම්බර් මස 19 සහ 20 යන දිනයන්හිදී පවත්වන ලදී. කිළිනොච්චි ආරක්ෂක සේනා ආඥාපති ගේ මූලිකත්වයෙන් පැවති මෙම පුණ්‍ය කටයුත්තට 57 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් බීපීඑස් ද සිල්වා ආර්එස්පී, 574 වන බළසේනාවේ බළසේනාධිපති කර්නල් අයිඒඑන්බී පෙරේරා ආර්ඩබ්ලිව්පී යූඑස්පී පීඑස්සී ඇතුළු නිලධාරීන් සෙබලුන් 400 කට වැඩි පිරිසක්ද, ප්‍රදේශයේ සිවිල් වැසියන් විශාල පිරිසක්ද සහභාගී වූහ.

---

# දැනුම දිනුමට අත්වැලක්...

කිළිනොච්චි භාරතීපුරම් ප්‍රදේශයේ පිහිටි ශ්‍රී ලංකා බැප්ටිස්ට් දේවස්ථානයේ අභිනවයෙන් ඉදිකරනු ලැබූ "හියුන්සියෝ ජෝ" සහ "ජියොන් නොහ්" අනුස්මරණ පුස්තකාලය විවෘත කිරීමේ උත්සවය ඉකුත් නොවැම්බර් 26 දින කිළිනොච්චි ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ජීවී රවිප්‍රිය ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී එන්ඩීයූ අයිජී ගේ ප්‍රධානත්වයෙන් සිදුවිය.

දකුණු කොරියානු "ග්ලෝබල් මිෂන්" දේවස්ථානය විසින් ඉදිකරන ලද මෙම පුස්තකාලය විවෘත කිරීමේ උත්සවය සඳහා ප්‍රදේශයේ පාසල් සිසු සිසුවියන් සහ සිවිල් ජනතාව ද සහභාගි වූහ. මෙම ව්‍යාපෘතිය සාර්ථකව නිමකිරීම සඳහා ජ්‍යෙෂ්ඨ දේවගැති පූජ්‍ය සුං ඉයුන් ඩේවිඩ් චෝයි පියතුමන්ගේ අධීක්ෂණය හා සහයෝගය නොමදව හිමිවිය.







# නිලධාරී පුහුණු වැඩසටහන....





59 සේනාංකය වෙතින් සංවිධානය කළ නිලධාරී පුහුණු වැඩසටහනක් ඉකුත් ඔක්තෝම්බර් 30 දින එම සේනාංක දේශන ශාලාවේදී පැවැත්විණ. මෙම අවස්ථාවට සේනාංකාධිපති බ්‍රිගේඩියර් කේඑච්පීපී ප්‍රනාන්දු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ගේ ආරාධනයෙන් මුලතිව් ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එච්ජේ සෙනෙවිරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ප්‍රධාන අමුත්තා ලෙස සහභාගි විය. මේ සඳහා 65 සේනාංකයේ සේනාංකාධිපති, ඉදිරි නඩත්තු පෙදෙස (මුලතිව්) ආඥාපති ඇතුලු ජ්‍යෙෂ්ඨ සහ කණිෂ්ඨ නිලධාරීන් 135 දෙනෙකු සහභාගි වූහ.

# සුහදත්වය වර්ධනයට ක්‍රීඩා තරඟාවලියක්.....

මුලතිව් ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එච්ජේ සෙනෙවිරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ අදහසකට අනුව එම මූලස්ථානයේ රාජකාරී කරනු ලබන නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ ක්‍රීඩා කෞශල්‍යයන් ඉහළ නැංවීමේ අරමුණින් සංවිධානය කෙරුණු ක්‍රිකට් සහ දැල්පන්දු තරඟාවලියක් ඉකුත් නොවැම්බර් 17 දින ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) ක්‍රීඩාංගනයේදී පවත්වන ලදී. ඊට මූලස්ථානයේ අංශ ආයතන යටතේ රාජකාරී කරනු ලබන නිලධාරීන් සහ සෙසුනිලයින් රැසක් සහභාගි වූහ.





# ආඥාපතිගේ සේනාංක සංචාරය....





ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් එල්එම් මුදලිගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ විසින් 14 සේනාංකයේ සහ ඒ යටතේ පාලනය වන බළසේනා මූලස්ථාන හා ඒකකයන්හි සිදුකරන ලද ප්‍රථම කඳවුරු සංචාරය ඉකුත් නොවැම්බර් මස 21 දින සිදුකරන ලදී. එහිදී සේනාංකාධිපති මේජර් ජෙනරාල් බීවීඩීපී අබේනායක යූඑස්පී එන්ඩීයූ විසින් ආඥාපතිතුමන් උණුසුම් අයුරින් පිළිගන්නා ලද අතර 142 බළසේනා මූලස්ථානය වෙතින් එතුමන් වෙත කඳවුරු සම්මාන මුරයක්ද පිරිනමන ලදී. එහිදි ආඥාපති විසින් සේනාංකය යටතේ සිටින භට පිරිස් අමතන්නටද කටයුතු කළේය.



ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් එල්එම් මුදලිගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ නව ධූරයේ රාජකාරී භාරගැනීමෙන් අනතුරුව ඉකුත් නොවැම්බර් 24 දින 114 බළසේනා මූලස්ථානයේ සහ 11 වන විජයබාහු පාබල රෙජිමේන්තුවේ සංචාරයක නිරත විය.

එහිදී 114 බළසේනා මූලස්ථානය වෙත සපැමිණි ආඥාපතිතුමන්ව එහි බළසේනාධිපති බ්‍රිගේඩියර් ඒසී ලමාහේවා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විසින් උණුසුම් අයුරින් පිළිගැනීමෙන් අනතුරුව බළසේනා මූලස්ථානයේ රාජකාරී සහ වගකීම් පිළිබඳ දැනුවත් කිරීමටද කටයුතු කරන ලදී.

# යුද්ධ හමුදා සෙබලුන්ගෙන් ලේ දන්දීමේ කඳවුරක්





බලන්ගොඩ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් සංවිධානය කරනු ලැබූ ලේ දන්දීමේ වැඩසටහනක් ඉකුත් ඔක්තෝම්බර් 30 දින බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය ශ්‍රවණාගාරයේදී සාර්ථක අයුරින් පවත්වන ලදී.

එම වැඩසටහන සඳහා ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් ජීජේඑල් වඩුගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ ගේ උපදෙස් හා මගපෙන්වීම මත ආසේමු භට පිරිස් පූර්ණ දායකත්වය ලබාදෙන ලදී. මිලින වන්නට ගිය වටිනා ජීවිතවලට යළි ප්‍රාණය ලබාදීම වෙනුවෙන් මෙම සත්කාරයට සහභාගි වූ භට පිරිස් වෙත හා සමස්ථ යුද්ධ හමුදාව වෙත සංවිධායක මණ්ඩලය විසින් හදපිරි කෘතඥතාවය පුද කරන ලදී.

# සෙබලුන්ගේ දැනුම වැඩුමට හරවත් දේශනයක්....





ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් ජීජේඑල් වඩුගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ ගේ උපදෙස් හා මගපෙන්වීම මත එම ආරක්ෂක සේනා මූලස්ථාන බලප්‍රදේශය යටතේ ස්ථාපිත පෙරපාසල් දරු දැරියන්ගේ දෙමව්පියන් වෙනුවෙන් "සියදිවි හානිකර ගැනීමට තැත්කිරීම හා සියදිවි හානිකර ගැනීම වැළැක්වීම" සඳහා වන මනෝවිද්‍යාත්මක දේශන මාලාවක් ඉකුත් ඔක්තෝම්බර් 28, 29 හා 30 යන තෙදින තුළ පැවැත්විණ. ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යා පීඨයේ ටෝච් සිනමා ශාලාව, දියතලාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, බණ්ඩාරවෙල නගරසභාව සහ බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී අදාල දේශන පවත්වන ලදී. මේ සඳහා ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) බලප්‍රදේශය යටතේ පාලනය වන ඒකක පුහුණු පාසල් හි රාජකාරී නියුතු යුද්ධ හමුදා සාමාජිකයින් සහ පෙර පාසල් දරු දැරියන්ගේ දෙමව්පියන් විශාල ප්‍රමාණයක් සහභාගි වූහ.

මෙම අවස්ථාව සඳහා දේශක මඩුල්ල වශයෙන් විද්වත් දේශකයින් වන මෙත්මලි මුණසිංහ සහ සෞම්‍යා මෙනවියද, වෛද්‍ය ලසන්ත විජේසේකර හා නිරන්ජන් මැදවල යන මහත්වරුද සහභාගි වූහ.

# අරගලය

## කෙටි කතාව

අතරමග මඳ වැසි ඇදහැලුනද ඉන් ආවරණය වන්නට තරම් වෙලාවක් සමන්තට නැත. රිඳුම් දෙන හිස ෆයිල් කවරයෙන් වසා ගත් ඔහු කඩිනම් ගමනින් නිවස වෙත ලඟා විය. පොත් හා ඇඳුම් බෑගය ඉස්තෝප්පුවේ ඇඳි පුටුව මත තැබූ ඔහු ආ සැනින්ම තම පියාගේ කාමරය වෙත එබුණේය.

"ඇයි තාත්තේ මේ"

ඇඳ මත උඩුකුරුව වැතිර බොහෝ අපහසු ඉරියව්වේ සිටින තම පියා අසලට වන් සමන්ත ඇසීය.

"උඹලගෙ එවුන් ගහපු ගල් වලට"

"තාත්තා මොන එහෙකට ආවද එතෙන්ට"

"මං කලේ රාජකාරිය. පොලීසිය හැටියට ඕවට මැදිහත් නොවෙනවනම් උඹ හිතුවද සතොසින් ඇවිත් ඕව බේරනව කියලා"

"ඒ උනාට තාත්තට තිබුනේ මඟඇරලා ඉන්ඩ"

"මග ඇරලා ඉන්ඩ... මඟඇරලා ඉන්ඩ තිබුන ඕඅයිසී මහත්තයා මගේ බාප්පා වුනානම්. මට කලින් උඹටනේ මඟඅරින්න තිබුනෙ. අනික මාව රස්සාවෙන් දොට්ට දැම්මොත් උඹ එනවද බේරගන්ඩ, මේ පුතේ, කරුණාකරලා වැඩක් බලා ගන්නවද."

ඇඳ මත හිඳගැණීමට අසාර්ථක උත්සහයක නියැලෙන අතරේ පද්මසිරි පැවසුවේය.

"ශිෂ්‍ය අයිතිවාසිකම් කප්පාදු කරනකොට,ශිෂ්‍යයො මර්ධනය කරන කොට ශිෂ්‍ය ඉල්ලීම් වෙනුවෙන් සටන් කරන එක වැරදිද? අනික තාත්තමයි මට පොඩි කාලේ ඉඳන් කියලා දුන්නේ වැරැද්දක් දැක්කම නිහඬව ඉන්නෙ නිවටයො කියලා"

සමන්ත හැකි උපරිමයෙන් පියා වෙත කරුණු පැහැදිලි කරන්නට වෙර දැරීය.

"නිහඬව ඉන්නේ නිවටයො බව හැබෑව පුතේ. ඒත් තේරුමක් නැතිව කෑගහන්නේ මෝඩයො. උඹලගෙ අයිතිවාසිකම් ගන්ඩ ඔයිට වඩා පිළිගත් ක්‍රමවේදයක් ඇත්තේම නැද්ද"

ඔහු එක එල්ලේ සමන්ත දෙස බලමින් පැවසුවේය.

"පිළිගත් ක්‍රමවේදවලට ආණ්ඩුව ඇහුම්කන් දෙන්නෙ නෑ තාත්තෙ. සාකච්ඡා වට කීයකටනම් අපි ගියාද?"

"උඹලගෙ මොලේ වැඩියි පුතේ. උඹලගෙ ඇඟපුරාම මොලේ. වේලාවකට උඹව විශ්ව විද්‍යාලයට යැව්ව එකත් මෝඩකමක් කියලයි මට හිතෙන්නෙ"

"මොකද මොකද මේ තාත්තලා පුතාලා සද්දෙ"

දොර රෙද්ද ඈත් කරමින් විමලා කාමරයට දිව ආවාය. එසැනින් දුටු දෙයින් ඈ වික්ෂිප්ත වූවාය.

"හත්දෙයියනෙ මගෙ පුතේ මොකද උනේ. උඹගෙ ඔළුව හැමතැනම වෙලාගෙන. උඹව වාහනයකටවත් හැප්පුනාද?"

"තාත්තලාගෙ වැඩ තමයි අම්මේ මේ"

"තාත්තලගෙ... ඒ මොන හතර බීරි කතාවක්ද. තාත්තත් කකුල තුවාල කරගෙනයි වැඩ ඇරිලා ගෙදර ආවේ. තාත්තලා පුතාලා දෙන්නම තුවාල කරගෙන"

"අපි කරපු සාමකාමී උද්ඝෝෂණයට මේ ගොල්ලෝ එලව එලව ගැහුවා"

සමන්ත තම පියා දෙස අත දිගු කරමින් පැවසුවේය.

"මොකක් කිව්වේ. මගේ මේ කකුල කැඩුනෙ උඹලගෙ උද්ඝෝෂණයේ සාමකාමීකම හින්දද? මේ ඇහුනද පුතේ උඹලා මේ පත්තරකාරයින්ට කියන කතා මෙහෙ ඇවිත් කියන්න එපා. දෙමව්පියො හැටියට උඹලව ලොකු මහත් කරන්න අපි මොන දුකක් විඳලා තියෙනවද. උඹලා විහින් නැහෙන්න හදන එකයි වේදනාව. ඕං මම නොකිව්වා කියන්න එපා. අදින් පස්සේ උඹ කරන ඕන හර්තාලයක් විශ්ව විද්‍යාලෙ ඇතුලේ ඉඳන් කරපං. පාරට එහෙම බහිනවා නෙවෙයි"

දැඩි අවවාදාත්මක ස්වරයෙන් පද්මසිරි පවසන්නට වූයේ ඇඳ වියනට බරවී නැගිටින්නට උත්සහ ගනිමිණි.

"අපි මේ විනෝදෙට උද්ඝෝෂණ කරනවා නෙවෙයි තාත්තේ, අනික ප්‍රතිපලයක් ගන්නව නං පාරට බහින්න ඕනෙ. එතකොටයි ආණ්ඩුවට දැනෙන්නෙ"

"ඔව් ඔය දැනට ගත්ත ප්‍රතිපලේ මදෑ. උඹ ඔළුව පලා ගත්තා. ඒ මදිවට මගෙ අණ්ඩකුත් කැඩුනා. මෝඩ නොවී මේ අහපන් සමන්ත. දැන් උඹලගෙ අරගලවලට නායකත්වය දෙන මිනිස්සු විශ්ව විද්‍යාලයෙන් එළියට ආවම තමන්ගේ පාර කපාගෙන ඉස්සරහට යනවා. පස්සේ කාලෙක ඒ මිනිස්සුමයි ලොකු ලොකු නිලතලවලට ඇවිත් උඹලටම විරුද්ධව ක්‍රියාමාර්ග ගන්නෙ. ඒ යථාර්ථය නොදැන ඕනවට වඩා ඇඟට අරගෙන දඟලන උන් අන්තිමේ ඉගෙන ගන්නෙත් නෑ රස්සාවක් කරන්නෙත් නෑ. එක්කො හිරේ විලංගුවේ. නැත්තම් ජීවිතේම අතරමඟ"








බොහෝ හැඟීම්බර විලාසයෙන් වූ සිය පියාගේ අවධාරණය හමුවේ වුව සමන්ත ඊට කන්දුන් සෙයක් පෙනෙන්ට නොවීය.

"තාත්තා එක්ක තර්ක කරලා තේරුමක් නෑ තාත්තෙ. ශිෂ්‍යයන්ගේ ප්‍රශ්න දිහා පොලිස් ඇහෙන් විතරක් බලලා හරියන්නේ නැහැ"

සමන්ත තම ස්ථාවරය පවසන්නට විය.

"මේ පුතේ උඹ හොඳට මතක තියා ගනින් වෙන ප්‍රශ්නවලදී මම කොයි විදියට බැලුවත් මේ ප්‍රශ්නෙදි මම බැලුවේ තාත්තා කෙනෙක්ගෙ ඇහෙන්. හැබැයි උඹ හදාගන්න ඕන හින්දා මට පොලිස් ඇහෙනුත් මේ ප්‍රශ්නේ දිහා බලන්න සිද්ධ වෙනවා"

පද්මසිරිගේ එවදන් ඇසෙත්ම සමන්ත ඉන් ඉවත්ව තම කාමරය වෙත වැදී දොර වසාගත්තේය.

........................................................

"ඔයාට අලුත් යුනිෆෝම් එකක් මහන්න වෙයි පද්මසිරි. දණහිස් ලඟත් හොඳටම ඉරිලා. ඒ මදිවට ලේ පැල්ලම්. ඔයිට කලින් තුම්මුල්ලෙ පෙළපාලියක් විසුරුවන්න ගිහිල්ලත් මේ විදියටමයි. යුනිෆෝම් නම් මහගන්න බැරුවැ. ඒ උනාට මේ විදියට තුවාල කරගත්තම...? මට නම් තේරෙන්නෑ මොනවා කරන්නද කියලා"

විමලාවතීගේ කතාබහට පද්මසිරි නිරුත්තරව බලාහුන්නා පමණි. ඔහුගේ සිත බෙහෙවින් ව්‍යාකූල වී ඇති සෙයකි.

"අපිට නොතේරුනාට පුතා කියන කතාවලත් ඇත්තක් ඇති මහින්ද... විමලාවතී නැවත කටහඬ අවදී කළාය"

"ඇත්තක් තිබුණත් නැතත් ඒ කතා අපිට නොතේරෙන එකමයි හොඳ. අපිට කප්පරක් ප්‍රශ්න තියෙද්දී. අපේ එකාව අපි විශ්ව විද්‍යාලයට යැව්වේ හොඳට උගන්වන්න ඕන නිසානෙ. ඌත් දැනගන්න ඕනෙ ඉගෙන ගන්න එකට මුල්තැන දෙන්න මිසක් වෙන වෙන වල්පල්වලට නෙවෙයි"

"කොහොම උනත් පුතා ඉතිං ඉස්සර ඉඳන් අරගලකාරයානෙ" විමලාවතී තරමක ආඩම්බරයෙන් යුතුව පැවසුවාය.

"අරගලකාරයා... මෙච්චර දෙයක් වෙලත් පුතාව සුද්ද කරන්න එපා විමලා. මේ පවුල ගොඩදාන්න මම කරන අරගලේ ඔයාට පෙන්නේ නැද්ද? අවුරුදු විසි අටක් තිස්සේ මම නැහෙන එක ගැන ඔයාට හැඟීමක් නැහැ. පොලිස්කාරයෙක් උනාම කී පොළකින් ඔළුව බේරගන්නද?

"හරි හරි පද්මසිරි මම ඔයාට වරදක් කිව්වෙ නැහැනෙ. සේරටම කලින් ඔයා සනීප වෙලා ඉන්නකො. ඉන්න මං ඔයාට වෙනිවැල්ගැට එකක්වත් හදාගෙන එන්නම්" විමලා සෙමින් සෙමින් කුස්සිය වෙත පියනැගුවාය.

........................................

රාත්‍රිය උදාවත්ම පද්මසිරිගේ ඇඟපත තව තවත් රිදුම් දෙන්නට විය. විමලා දුන් වෙනිවැල්ගැට කෝප්පයට පින්සිදු වෙන්නට ඔහු යාන්තමින් හිස එසවූයේය. තුවාල හේතුවෙන් පසු දින සිට දින කිහිපයක් වෛද්‍ය නිවාඩු හිමිව තිබීම ඔහුගේ අස්වැසිල්ලට හේතුවකි. කෙසේ වූවද තම පුතා පිළිබඳ ඔහු තුළ පහල වූයේ බියජනක සිතුවිල්ලකි. විශ්ව විද්‍යාල ප්‍රශ්නය දිනෙන් දින උග්‍රවන හෙයින් එහි සිසුන්ගේ උද්ඝෝෂණ උපවාස ආදියද ඉදිරියේදී තව තවත් කරලියට පැමිණීම නොවැළැක්විය හැකිය. කුමන අයුරකින් හෝ තම පුතා මේවාට පැටලෙනු ඇති බව ඔහුට දැනිණ.

"ඔයාට බැරිද වෙන පොලීසියකට මාරුවක් ගන්න"

පද්මසිරි සමීපයට වන් විමලා ඇඳෙහි කොනක වාඩිවෙමින් කතාවට මුල පිරුවාය.

"ට්‍රාන්සර් ගැන නම් කතා කරන්න එපා. අනික මොන එහෙකටද හදිස්සියේ මාරුවෙන්නෙ"

"නෑ මම නිකමට වගෙ ඇහුවෙ. කොළඹ ඉන්න නිසානෙ ඔයාට ඔය හැමදේකටම පැටලෙන්න වෙලා තියෙන්නෙ"

"විකාර කියන්න එපා විමලා. කොහේ හිටියත් පොලිසියේ රාජකාරිය එකයි. සේරටම කලින් පුතණ්ඩියට තේරුම් කරලා දෙන්න රටේ ජීවත් වෙන විදිහ"

" තරුණ වයස් වල ළමයි එහොම තමයි පද්මසිරි. ආවේගශීලී වෙන එක අහන්න දෙයක්යැ. ඔය තරම් ගණන් ගන්න එපා."

විමලා පද්මසිරිගේ සිත සැහැල්ලු කරන අටියෙන් පැවසුවාය.

" එහෙනම් විමලා ආවේගශීලී වෙන එවුන් පොලීසියෙන් මෙච්චල් කරන එක ගැනත් ඔයා ඒ හැටි ගණන් ගන්න එපා"

පද්මසිරි ඇඟට පතට නොදැනී කීවේය.

" ඔය ඉතින් හරහටමනේ කතාව. තාත්තල පුතාල ඕන එකක් කරගත්තාවයි. මමනම් ඇහැක් ඇරලා බලන්නේ නෑ...විමලා ඉක්මන් ගමනින් එතැනින් ඉවත් වූවාය "

........................................

" අද කැම්පස් පටන් ගන්නවද පුතා"

සමන්ත තම යතුරු පැදිය පන

ගන්වන්නට සූදානම්වන අතරේ මව ඇසුවාය.

" සේරම නෙවෙයි අම්මේ සයන්ස් ෆැකල්ටියයි, අපෙයි විතරයි "

"කොහොම වුනත් ආයේ කලබල ඇති වුනොත් ගෙදර වරෙන් පුතේ. එක එක දේවල් වලට පැටලෙන් නැතිව "

විමලාවතී බෑගය තම පුතු අතට දෙන අතරේ පැසුවාය.

"යන ගමන් තාත්තවත් ටවුන් එකෙන් දාගෙන යන්න පුතා. තාත්තගේ මෙඩිකල් ලිව් ඊයෙන් ඉවරයිනෙ"

ඕ සාලය දෙස නෙත් යොමමින් කීවාය.

"නෑ...නෑ...නෑ... මට ඔය ටික පයින් යතැහැකි. මෙයාගෙ තියෙන දැඟලිල්ලට ආයෙ තව එකක්. ගමන් මල්ලද අතැතිව පද්මසිරි ඉස්තොප්පුවට පැමිණෙන අතරේ පැවසීය.

" මං ඊයෙ කියපු දේවල් ආයේ අමතක කරනවා එහෙම නෙවෙයි පුතා"

පද්මසිරි පෙරදා දුන් අවවාද පිළිබඳ නැවතත් සමන්තට මෙනෙහි කළේය.

" කැමැත්තෙන් හරි අකමැත්තෙන් හරි පන්ති වල සේරම උද්ඝෝෂන වලට යන්න ඕන තාත්තේ. එහෙම නැති වුනොත් අපි කැමපස් ඉඳලා හමාරයි. දැන් තියෙන තත්ත්වෙ අනුව පරිස්සම් වෙන්න ඕන මම විතරක් නෙවෙයිනේ "

"නෑ...නෑ...නෑ... අනෙක් අයගේ පරිස්සම ගැන උඹ බය වෙන්න එපා, උඹ තාම ඉගෙන ගන්න කෙනෙක්. ඒ බව තේරුම් අරගෙන වැඩ කරපන් "

මොහොතකුදු නතර නොවුනු පද්මසිරි විමලාවතීටද සමුදී පිටත් වූයේය. සමන්තද යතුරුපැදිය පනගන්වා ගනිමින් ඉගිල ගියේය. මවක හා බිරිඳක ලෙසින් විමලාවතී තම පුතුගේ හා ස්වාමියාගේ ගැටළු හමුවේ බෙහෙවින් අසරණ වී ඇත. ඕ අතුරු මඟ දිගේ ඈතට යන පද්මසිරිගේ රුව දෙස බලා සිටියාය.

..................................

පෙඟෙන්නට දමා තිබූ සිය පුතුගේ හා පද්මසිරිගේ ඇඳුම් ගොන්න එකින් එක සේදූ විමලා ඒවා සියල්ල රෙදි වැලෙහි වනා දැම්මාය. තැනින් තැන ඉරී ලේ පැල්ලම් නොසේදුනු පුතුගේ කලිසමක හා ටී ෂර්ට් එක ද එහි විය. බොත්තම් කිහිපයක් ගැලවී ඉරී ගිය පද්මසිරිගේ නිල ඇඳුමෙහි දෙතැනකම ලේ පැල්ලම් ද සේදී නොමැත. නැවත පාවිච්චියට ගත නොහැකි වුවද විමලාවතී ඒවා සේදුවේ පුරුද්දටකට මෙනි.

නිවස තුළට පිවිසි විමලා පුටුවකට බර වූවාය. මද්දහන එළඹ තිබූ හෙයින් ඇය තුලින් දිස් වූයේ තරමක විඩාබර බවකි. ඒ නිසාමදෝ ඇය රූපවාහිනිය ක්‍රියාත්මක කරන ලද්දේ නිකමට මෙනි. එහිදී ඇය දුටුවේ අනපේක්ෂිත දෙයකි. විශ්ව විද්‍යාල සිසුන්ගේ උද්ඝෝෂණ මාලාවක රූපරාමු එක දිගට විකාශනය කෙරේ. නාම පුවරු රැගත් ඇතැම් සිසුන් අතර  පොලු මුගුරු වැනි දෑද දිස් වේ. සිසුන්ගෙන්
පිරී මහා මාර්ගය තුළ වාහන ධාවනය ද සම්පූර්ණයෙන්ද ඇනහිට ඇත. යුහුසුලුව එහෙ මෙහෙ දිව යමින් කෑකෝ ගසන ළමුන් දෙස විමලාවතී මුව අයාගෙන බලා සිටියාය.

ඈ තුළ තිබූ නොඉවසිලිමත් බව කෙසේද යත් විමලාවතී නොදැනුවත්වම පුටුවෙන් නැගිටුනාය.
අධි ආරක්ෂිත කලාපයක් පසුකර යාමට ළමයින් දරන උත්සාහය ව්‍යර්ථ කිරීමේ අටියෙන් කැරලි මර්ධන පොලීසියද ආරක්ෂිත නිල ඇඳුමින් සැරසී බැටන් පොලුද අතැතිව පෙරට එමින් සිටී. ක්‍රමයෙන් සිසුන් අධි ආරක්ෂිත කලාපයට ඇතුල්වීමට උත්සහ දරනු පෙනේ. පොලීසිය ද එය නවතාලීම සඳහා දැඩි පරිශ්‍රමයක නියැලේ.

විමලාවතී රූපවාහිනිය දෙස බලමින් සාලය පුරා ඔබ මොබ ඇවිදින්නට වූයේ අරමුණකින් තොරවය. කඳුළු ගෑස් හා රබර් උණ්ඩ වලින් ද සන්නද්ධ වූ තවත් පොලිස් බලඇණියක් වාහන කිහිපයකින් පැමිණ ප්‍රදේශයේ ආරක්ෂාව තහවුරු කරන්නට විය. යුධ පිටියක ස්වරූපයේ ඇවිලී යන සිදුවීමක් අත ළඟය. විමලාවතීට ඉහිලුම් නැතිවිය.

" දෙයියනේ... පුතත් මේ පෙළපාලි වල ඇති කොච්චර කිව්වත් අපේ එකා අහනවයැ  "

ඕ තමාටම කියා ගන්නට විය.

සිසුන්ගේ හැසිරීම සීමාව ඉක්මවා යන සෙයක් පෙනේ. පොලීසිය වහා ක්‍රියාත්මක වී බැටන් පොලු පහරවල් දියත් කරන්නට විය. සිසුහුද අතට අසුවන පොලු මුගුරු හා ගල් ප්‍රහාර පොලීසිය වෙත එල්ල කරන්නට පටන් ගත්හ. සිසුනගේ ප්‍රහාර හමුවේ කැරලි මර්ධන පොලිස් නිලධාරින් කිහිප දෙනෙකුට ද තුවාල සිදුවන අයුරු පෙනේ. එක් වරම පොලිස් නිලධාරියෙකු තුවාල වී බිම වැටෙන අයුරු සජීවී රූපරාමු ඔස්සේ දිස්වූයේය.

" දෙයියනේ... පද්මසිරි ඔයා.."

ඇයට කෑ ගැසුණි.

ඒ සමගම අත්අඩංගුවට ගත් සිසුන් දෙදෙනෙකුද පොලිස් නිලධාරින් ඇදගෙන ගොස් ජීප් අථයට නංවන ආකාරය දර්ශනය විය.

ඇය තුෂ්නිම්භූත වූවාය. තම පුතා උදේ ඇඳගෙන ගිය ආකාරයේ ඇඳුමට සමාන ඇඳුමකින් එක් සිසුවෙකු සැරසී සිටීම එයට හේතුවයි. විමලාවතී මොර දෙමින් හඬන්නටක් විලාප තියන්නටත් වූවාය.

" අනේ සමන්ත. උඹ ආයෙත් ඕවට පටලැවෙන්න ගියාද. අනේ පුතේ... ඈ මොර දුන්නාය. වහ වහා දොර ජනේල් වසා දැමූ විමලා නගරය වෙත යාමට සූදානම් වූවාය. එවිටම දුරකථනය නාද වන්නට විය. ඇය දෙගිඩියාවෙන් රිසිවරය අතට ගත්තාය."

"හලෝ"

" හා විමලා...මම අද හාෆ්ඩේ දැම්ම. මම මේ මාකට් එක පැත්තෙන් එන ගමන් මොනවද ගේන්න ඕන."

" දෙයියනේ පද්මසිරි ඔයා..."

ඇය මොහොතක් නිරුත්තර වූවා සේය.

" ඇයි ඇයි මොකද මේ ඔයා හති දානවා ඇහෙන්නේ "

" නෑ නෑ පද්මසිරි ඔයා කැමති දෙයක් අරගෙන ඉක්මනට ගෙදර එන්න"

ඇය රිසිවරය තැබුවාය.

එවිටම මිදුල දෙසින් යතුරු පැදියක හඬක් ඇසිණ. විමලාවතී හනිකට ඉස්තොප්පුවට දිව ආවාය.

" දෙයියනේ සමන්ත... උඹ අද විශ්ව විද්‍යාලේ ගියේ නැද්ද ?"

යතුරු පැදියෙන් බැසි සිය පුතු දෙස බලා ඇය විමතියෙන් ඇසීය.

"අදත් කැම්පස් වහලා අම්මේ"

" එතකොට මේ ටීවී එකේ පෙන්නන කලඹල උබලගේ විශ්ව විද්‍යාලේ නෙවෙයිද ?"

ඒ "ජ"පුරෙ නෙ අම්මේ. අපි ඕවට සම්බන්ධ නෑ"

විමලාවතී අසළ තිබූ ඇඳි පුටුවට බර වූයේ ඉබේටමය. උද්ඝෝෂණයට එක්ව සිටින තම පුතුගේ රුවද ආරක්ෂිත හෙල්මට් පැළඳ බැටන් පොල්ලක්ද අතැතිව සිටින තම ස්වාමියාගේ රුවද විමලාවතීට මැවී පෙනෙන්නට වූවාය. විශ්ව විද්‍යාල සිසුන් හා රජය අතර පවතින අරගලයට විසඳුම් කොතෙකුත් පමා වුවද බිරිඳක ලෙසින් එය තම ජීවිතයට මෙතරම් බලපෑමක් එල්ල කරාවියැයි ඇය කිසිදා නොසිතුවාය. හිස ඉහලට හොවාගත් ඈ හෙලූ දිගු සුසම වහලයටද දැනෙන තරම් විය.

නිමි.



මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ

## අධිෂ්ඨානශීලී පාද යාත්‍රාවක්....



ආබාධිත රණවිරුවන්ගේ චිත්ත ධෛර්යය වර්ධනය කරවීමට සහ සාමාන්‍ය ජනතාවට ආදර්ශයක් ලබාදීමේ අරමුණින් 2(සෙව්) ගජබා රෙජිමේන්තුවේ සේවයේ කරනු ලැබූ සෙ/2ජී02494 සාසෙ පියතිස්ස ආර්ඩබ්ලිව්පී සහ නාවික හමුදාවේ සේවය කරනු ලැබූ එච්එච්13837 ප්‍රධාන සුලු නිලධාරී එම්බීඩබ්ලිව් කුමාර ආර්එස්පී යන ආබාධිත රණවිරුවන් දෙදෙනා විසින් ඉකුත් නොවැම්බර් 22 දින ඓතිහාසික නාගදීප පුදබිමේ සිට කතරගම කිරිවෙහෙර පුදබිම දක්වා පාද යාත්‍රාවක් අරඹන ලදී.

මෙම පාද යාත්‍රාව අවසන් වනතුරු සියලුම අවශ්‍යතා යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් පීආර් වනිගසූරිය වීඑස්වී යූඑස්පී එන්ඩියූ පීඑස්සී යූඑස්ජ්සීජීඑස්සී ගේ උපදෙස් පරිදි එම ආසේමු භට පිරිස් විසින් සම්පාදනය කරන ලදී. මෙහි සමාරම්භක අවස්ථාව සඳහා ආගමික නායකයින්, 52 සේනාංකයේ සේනාංකාධිපති, බළසේනාධිපතිවරු, නිලධාරීන්, යුද හා නාවික හමුදා සාමාජිකයින් විශාල පිරිසක් සහභාගි වූහ.

## පූජා සත්කාරයන්ට මුල්තැන දෙමින්....



ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් එච්ජේඑස් ගුණවර්ධන ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ උදාර සංකල්පයකට අනුව 21, 54 සහ 61 සේනාංක බළප්‍රදේශයන්හි ජීවත්වන විවිධ හේතූන් මත අත් පා අහිමිව ආබාධිත තත්වයට පත්ව සිටින අයවලුන් වෙනුවෙන් කෘත්‍රිම අත් පා බෙදාදීමේ වැඩසටහනක් දියත් කෙරිණ. මෙම මාහැඟි සත්කාරයට මහනුවර Center for Handicapped ආයතනය දායකත්වය සපයන ලදී.

## රණවිරු දෑතින් මැවූ සිත්තම්






ශ්‍රී ලංකා යුද්ධ හමුදා සාමාජිකයින් තුළ ඉතිරි කිරීම හා සකසුරුවම් පුරුද්ද වර්ධනය කිරීමත් යුද්ධ හමුදා යහසාධක අරමුදල් අධ්‍යක්ෂ මණ්ඩලයේ ආයතනික සේවාව ප්‍රදර්ශනය කිරීමත් පිණිස වූ අර්ථාන්විත බිතු සිතුවමක් "යහසාධක පියස" තෙමහල් ගොඩනැගිල්ලෙහි ඉදිරිපස බිත්තිය මත සිතුවම් කර ඇත. එම සිතුවම 4 ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බළකායට අයත් මාණ්ඩලික සැරයන් බණ්ඩාරනායක කේඑම්ජ් විසින් නිර්මාණය කර ඇත.

# සුබ මොහොතින් විවෘත වූ සෙසුනිල භෝජනාගාරය ....






591 බළසේනා මූලස්ථානයේ නවතමයෙන් ඉදිකරන ලද අංගසම්පූර්ණ සෙසුනිල භෝජනාගාරය ඉකුත් ඔක්තෝම්බර් 23 දිනට යෙදී තිබූ සුබ මොහොතින් සෙසුනිල අයිතියට පැවරිණි. බළසේනාධිපති කර්නල් ඩබ්ලිව්එම්එස්සීකේ වනසිංහ ආර්එස්පී යූඑස්පී ගේ පූර්ණ මගපෙන්වීම යටතේ යුද්ධ හමුදා සාමාජිකයින්ගේ ශ්‍රමදායකත්වයෙන් ඉදිවූ එම ගොඩනැගිල්ල 59 සේනාංකයේ සේනාංකාධිපති බ්‍රිගේඩියර් කේඑච්පීපී ප්‍රනාන්දු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ගේ සුරතින් විවෘත කරන ලදී.

## හරවත් දිවියකට උපදෙස්....



යුද්ධ හමුදාධිපතිතුමාගේ උපදෙස් පරිදි නිවාරණ වෛද්‍ය හා මානසික සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ණ අධීක්ෂණය යටතේ යුද්ධ හමුදා සාමාජිකයින්ගේ සියදිවි හානිය වැළැක්වීම සහ ඔවුන්ගේ මානසික ආතතිය නැති කිරීමේ අරමුණින් වූ මනෝවිද්‍යාත්මක දේශණ මාලාවක් පසුගියදා පැවැත්විණ. සියලුම ආරක්ෂක සේනා මූලස්ථාන ආවරණය වන පරිදි සංවිධානය කෙරුණු එහි එක් වැඩසටහනක් ඉකුත් නොවැම්බර් 06 දින ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් එච්ජේ සෙනෙවිරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් එම මූලස්ථාන දේශණ ශාලාවේදී සිදුකෙරිණ.

යුද්ධ හමුදා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ සම්බන්ධීකරණයෙන් පැවැති එම වැඩමුලුවට ඉදිරි නඩත්තු පෙදෙස (මුලතිව්), සේනාංක, බළසේනා සහ ඒකකයන්හි නිලධාරීන් 40 ක් සහ සෙසුනිලයින් 207 ක ප්‍රමාණයක් සහභාගි වූහ.

## 16 වන සංවත්සරය අභිමානවත්ව සමරමින්

වැලිකන්ද ප්‍රදේශයේ ස්ථාපිත නැගෙනහිර ආරක්ෂක සේනා මූලස්ථානයේ 16 වන සංවත්සරය ඉකුත් ඔක්තෝම්බර් 30 දිනට යෙදී තිබූ අතර, ඒ නිමිත්තෙන් මේජර් ජෙනරාල් එච්ආර්එන් ප්‍රනාන්දු ආර්එස්පී එන්ඩීසී ගේ උපදෙස් මත වැඩසටහන් මාලාවක් සංවිධානය කර තිබුණි.

එහිදී ආඥාපති වෙත කඳවුරු සම්මාන මුරයක් පිරිනැමීම, සියලු නිල තේපැන් සංග්‍රහයක් පැවැත්වීම හා දිවා භෝජන සංග්‍රහයක් පැවැත්වීම සංවත්සර දින වැඩසටහන් අතර ප්‍රධාන විය. එසේම සංවත්සර සැමරුම් උත්සවයට සමගාමීව කඳවුරු පරිශ්‍රයේ පැළ 1000 ක් රෝපණය කිරීමේ වැඩසටහනක්ද ක්‍රියාත්මක කෙරිණ.



# සිතුවිලි සාගරය

## අහිමි ආදරය

අඳුර එනකොට දැනෙන තනියට
රැහැයි ගී තනු වැයුවා...
රැයේ තනිකම මකන්නට නුඹ
මගෙ ලඟට වී සිටියා...
නුඹෙ නමට හෙලූ කඳුලු සුසුම්
සීත සුලඟට මුසු වුනා...
ඔබේ ආදර වචන රුව මට
මකන්නට මට තාම බැරි වුනා...
එදා සෙනෙහෙන් සිටි අප හද
නුඹට අමතක වී ඇත...
කතා කරන්නට දකින්නට
නැති වුනත් නුඹ මට
හදවතේ රැඳෙයි නුඹේ මතකයන්...
ඔබේ බොරු ආදරය මට
වැටහුනේ නැත කිසි දිනේ...
දුරක නුඹ ගිය හැර දමා මා
මගේ හද නුඹ සොයමි හැම තැන්...
තාම ආදරෙයි නුඹට මගෙ පන තරම්...

සෙ/ඊ100739 රසෙ ජේමචන්ද්‍ර ඩීඩබ්ලිව්ජ්වී
3(සෙවි) ශ්‍රීලංසිරේ
යුහ කඳවුර - නුවරඑළිය

## සෙබළ සොයුරියේ

දුක් හඳුනන....
දුක් විඳින... සොයුර සමය කැප කරන
වේදනාව, තනිකම දැනෙන
නුඹත් වීර සෙබළියෙකි
නිල ඇඳුම අඳින...
දැනෙයි මා හටද ඒ දුක...
කිමද මාද නුඹ සේම
ජීවිතයේ සොඳුරු සමය කැපකරන
සෙබළෙකි...
නිල ඇඳුම අඳින...
අභීත සෙබළියේ
නුඹත් වීරවරියෙකි
මේ ලක් දෙරණේ සදා නොමැරෙන...
නුඹ නිල ඇඳුම ඇන්දාට
නුඹත් ගැහැණියකි
මා බිහිකළ අම්මා සේම...

සෙ/කිව්104364 සාසෙ බණ්ඩාර කේඑම්ඒඑච්
9 ශ්‍රීලංජාආබමු
යුද හමුදා කඳවුර
සුගන්ධිපුරම්

## කාර්යාලය

මූනිච්චාවට හොඳ මූණ පෙන්වගෙන
ඇති තැනදී පණ දී
නැති තැනදී කපලාම දාන
තමන්ගේ වාසියට පමණක්
ලඟට එන
කාර්යාලය කියන්නේ
අමුතුම තැනක්
මිනිස්සු ගැන හරියටම කියාදෙන...

සෙ/654140 කෝප්‍රල් ලියනගෙදර එන්ඩී
3 ශ්‍රීලයුවෙබ
යුද හමුදා කඳවුර
නෙළුම්කුලම
අනුරාධපුරය

## අහිමි විය සෙනෙහස

මා පුංචි කල
සුරතල් බැලූ ඔබ
සුලගිල්ල අල්ලන්
ඇවිද යන්න දැන් මම
ලොකුයි...
ඔබ මගේ ලෝකයෙන්
සමු අරන් ගිය දිනේ
පටන්...
ලෝකයේ පියවරු දකින විට
හැඟෙයි ඔබ මගේ
හද මඩලට
මගේ හද ගැඹුරේ
නොනිවි දැල්වෙන පහන ඔබයි
පියාණනේ...

සෙ/380968 රසෙ රත්නායක ආර්එම්එන්යුකේ
20 ශ්‍රීලංසිරේ යුහ කඳවුර
පේරියවලයන්කඩ්ඩු



## නිදිමත

සිත විඳින සොඳුරුකම්
හද විඳවන කුරිරුකම්
රැගෙන යන ජීවිතේ
තිබුණි කම්කටොලු
සිත දුවන මාවතේ
හදවතින් රැගෙන යන ජීවිතේ
සොඳුරුතම අත්වැලක්
වුණි මටද පිංබිමක්
නැවතුණු කඩඉමේ
බලාහිඳ ගිමන් හරින්නට
දුනිම් හොඳ නවාතැනක්

සෙ/59476
බනි 11 කෝකිලා ඒපීජී
රෙම ශ්‍රී ලංකා යුද්ධ හමුදා
කාන්තා බළකාය
යුහ කඳවුර - බොරැල්ල

## රණවිරු සවිය

ජාතික ජධය සිම්බා කොටියගෙ කකුල
දැනුනා එවිට විරුවගෙ හදවත පතුල
කෙරුවා විරුවගේ හදවත නව අවුල
ඇයි නොදැනෙන්නෙ මට මෙන් හැම කෙනෙකුටම

සෙ/331952 සාසෙ ගුණසේන ආර්ඒඩීකේ
23 ශ්‍රීලපාහ
යුහ කඳවුර - වව්නියාව

## ආගන්තුක ආදරය

සොයුරනේ නුඹ හමුවුනි නම් යුද වැදී
සමුදෙම් මම උණ්ඩයෙන් එක සැනෙකින්
වැතිරෙම් බිම සමරම් නුඹේ පෑ එඩි
සුරකිම් නුඹේ නෑසියන් මගේ පනමෙනි

සෙ/479646 ලා/කෝ ආරියරත්න වයිපීඑන්
24 වන බළඇණිය ගජබා රෙජිමේන්තු
යුහ කඳවුර - මන්නාරම

## 27 වසක් අභිමානයෙන් පෙරට....





8 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු බළඇණියේ අභිමානවත් 27 වන සංවත්සරය ඉකුත් ඔක්තෝම්බර් 16 වන දිනට යෙදී තිබුණි. ඒ නිමිත්තෙන් අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ජේආර්බීඩබ්ලිව් පල්ලේකුඹුර ගේ ප්‍රධානත්වයෙන් වැඩසටහන් රැසක් පවත්වන ලදී. එහිදී අණදෙන නිලධාරීගේ නිළ උසස්වීම සමරනු වස් පැවති සම්මාන පෙළපාලිය, රුක් රෝපණ වැඩසටහන, සියලු නිල දිවා භෝජන සංග්‍රහ හා සංගීත ප්‍රසංගය එම වැඩසටහන් අතර කැපී පෙණුනි.

## සිංහ රෙජිමේන්තු අන්තර් ඒකක එල්ලේ තරඟාවලිය - 2019



ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව මගින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන අන්තර් ඒකක එල්ලේ තරඟාවලිය ඉකුත් නොවැම්බර් 07 සහ 08 යන දෙදින තුළ සිංහ රෙජිමේන්තුවට අයත් ඒකකයන්ගේ සහභාගීත්වයෙන් යුතුව ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) හි ස්ථාපිත 3 වන කමාන්ඩෝ රෙජිමේන්තු ක්‍රීඩා පිටියේදී පැවැත්විණ. එහිදී සමස්ත තරඟාවලියේ ශුරතාවය 21 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව විසින් දිනාගන්නා ලදී. එම අවස්ථාව සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස 563 බළසේනාවේ බළසේනාධිපති කර්නල් කේපීජ් පෙරේරා ආර්එස්පී සහභාගි වූ අතර, යුද්ධ හමුදා නිලධාරීන් සහ සෙසුනිලයින් විශාල පිරිසක්ද ඊට එක්වූහ.



## 12 වසරක ගමන්මඟ සමරමින්....

12 වන බළඇණිය ශ්‍රීළ ලංකා සිංහ රෙජිමේන්තුවේ 12 වන සංවත්සරය ඉකුත් ඔක්තෝම්බර් 22 දිනට යෙදී තිබුණි. ඒ නිමිත්තෙන් ඒකකයේ වැඩසටහන් රැසක් පැවැත්වුණු අතර එහිදි අණදෙන නිලධාරී වෙනුවෙන් සම්මාන මුරයක් සහ සම්මාන පෙළපාලියක් පැවැත්වීම, සියලු නිල දිවා භෝජන සංග්‍රහයක් පැවැත්වීම හා ආගමික වතාවත් වලට ප්‍රධානත්වයක් හිමි විය. තවද අන්තර් කණ්ඩායම් කඹ ඇදීමේ තරගාවලිය, ක්‍රිකට් තරගාවලිය හා ලේ දන්දීමේ වැඩසටහන එහි පැවති සෙසු වැඩසටහන් අතර කැපීපෙණුනි.





## සුහද ක්‍රිකට් තරඟාවලියක්....



59 සේනාංකයේ 12 වන සංවත්සරයට සමගාමීව ඒ යටතේ ස්ථාපිත සියලුම බළසේනා, ඒකක සහ බළඇණි පුහුණු පාසල නියෝජනය කරමින් පැවැති සුහද ක්‍රිකට් තරඟාවලියක් ඉකුත් නොවැම්බර් 23 දින 593 බළසේනා ක්‍රීඩාංගනයේදී පැවැත්විණ. ක්‍රීඩාලෝලීන් රැසකගේ සහභාගීත්වයෙන් පැවති එම තරඟාවලියට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස එහි සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේඑච්පීපී ප්‍රනාන්දු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ සහභාගී විය. එහි අවසන් තරඟයේදී 19 ගැමුණු හේවා බළඇණි ක්‍රිකට් කණ්ඩායම පරාජය කරමින් අභියෝගාත්මක තරඟයකින් අනතුරුව 593 බළසේනා ක්‍රිකට් කණ්ඩායම තරඟාවලියේ ශුරතාවය හිමිකර ගැනීමට සමත්වූහ.

## කෙළිබිමෙහි දස්කම්...





කිළිනොච්චි ආරක්ෂක සේනා මූලස්ථානයට අයත් සියලුම සේනාංක, බළසේනා සහ ඒකක අතර සුහදත්වය වර්ධනය කිරීමේ අරමුණින් සංවිධානය කෙරුණු විස්සයි විස්ස සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟාවලියක් පසුගියදා පැවැත්විණ. ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ජීවී රවිප්‍රිය ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී එන්ඩීයූ අයිජී ගේ ප්‍රධානත්වයෙන් පැවති එම තරඟාවලියේදී සියලු කණ්ඩායම් අභිබවමින් 20(සෙව්) විජයබාහු ජාබල රෙජිමේන්තු කණ්ඩායම දක්ෂතම පන්දු යවන්නාට හිමි කුසලානය සහ තරඟාවලියේ වීරයාට හිමි සම්මානය ද සමගින් එහි ශූරතාවය හිමිකර ගන්නා ලදී.

## බළඇණි සංවත්සරය සමරයි

22 වන බළඇණිය ගජබා රෙජිමේන්තුවේ 10 වන සංවත්සරය ඉකුත් ඔක්තෝම්බර් 23 දින මැණික්ෆාම් බළඇණි පුහුණු පාසලේදී උත්සවශ්‍රීයෙන් සමරන ලදී. එහිදී එම ඒකකය සිදුකරන බළඇණි පුහුණු පාඨමාලාවට සමගාමීව පුරාතන සිංහල රණකාමීන්ගේ අභිමානය විදහා දැක්වෙන "මුල්ලේරියා සටන" පිළිබඳව ඉදිරිපත් කිරීමක් එහි නිලධාරීන් හා සෙසුනිලයින් විසින් සිදුකරන ලදී. එම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස වන්නි ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එච්ජේඑස් ගුණවර්ධන ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහභාගි විය. තවද 21, 54, 56, 61, 62 සේනාංකයන්හි සේනාංකාධිපතිවරු ඇතුලු නිලධාරීන් සෙසුනිලයින් විශාල පිරිසක්ද එම අවස්ථාවට එක්වූහ.



## ඒකක සංචාරයේ නිරතවෙමින්....





9 වන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව යාපනය වරිතවිලාන් ප්‍රදේශයේ නවතමයෙන් ස්ථානගත වීමෙන් පසු 51 සේනාංකයේ සේනාංකාධිපති බ්‍රිගේඩියර් බීඒඑල් රත්නායක ඉකුත් ඔක්තෝම්බර් 21 දින එහි කඳවුරු සංචාරයක නිරතවිය. එහිදී ඒකක අණදෙන නිලධාරී මේජර් ඒඩී ගුණරත්න ආර්එස්පී ශ්‍රීලපාහ ඇතුලු සියලු නිලයින් සේනාංකාධිපති වෙත කඳවුරු සම්මාන මුරයක් පිරිනමමින් මහත් හරසරින් යුතුව පිළිගන්නා ලදී.

## සංවත්සර දිනය අර්ථවත්ව සමරමින්....





14 (සෙව්) ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් කේඑල් මුණසිංහ යූඑස්පී ගේ මඟපෙන්වීම යටතේ 70 වන යුද්ධ හමුදා දිනයට සමගාමීව පැලවත්ත-බත්තරමුල්ල ශ්‍රී ධර්මාලෝක බෞද්ධ මධ්‍යස්ථානයේදී ආගමික වැඩසටහන් මාලාවක් සිදුකරන ලදී. එදින දහවල් දානමය පිංකම් කටයුතු ඒකකයේ සියලුම නිලධාරීන් හා සෙසුනිලයින්ගේ සහභාගීත්වයෙන් සිදුකළ අතර, රාත්‍රී බෝධි පූජාව හා ධර්ම දේශනාව රුහුණු විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය මොරගහකන්දේ ආරියවංශ හිමියන් විසින් සිදුකරන ලදී.

## සිසු දරුවන් වෙනුවෙන් හරවත් දේශනයක්....

ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් එල්එම් මුදලිගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ උපදෙස් මත 14 සේනාංකයේ සේනාංකාධිපතිගේ අධීක්ෂණය යටතේ බොරැල්ල සියලු සාන්තුවරුන්ගේ විදුහලෙහි 06 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා සිසුවියන් සඳහා වූ දේශනයක් ඉකුත් ඔක්තෝම්බර් 29 දින පැවැත්විණ. හදිසි අනතුරු අවස්ථාවකදී හා ත්‍රස්ත ප්‍රහාරයක් සිදුවුවහොත් ගුරුභවතුන් හා සිසුන් කටයුතු කළ ආකාරය පිළිබඳ දැනුවත් කිරීම පිණිස වූ එම දේශනය 14 සේනාංකයේ ප්‍රමානි 1 - සම්බන්ධීකරණ නිලධාරී වශයෙන් රාජකාරී කරනු ලබන ලුතිනන් කර්නල් එම්බීබී හේරත් ආර්එස්පී විසින් මෙහෙයවනු ලැබීය.



# සිතුවිලි සාගරය

## අම්මා

ජීවිතයට බොහෝ දෙනා එනවිට
බොහෝ දෙනා යාවි
නමුත් එදා මෙදා තුර
නොවෙනස්ව නොඅඩුව ලැබුණු
එකම ආදරය ඔබෙන් ලද ආදරයයි
මා දයාබර අම්මේ....
මේ පදවැල් ඔබ වෙනුවෙනි
අඳුරු මංපෙත් විවර කරමින්
පාර කිවමැන හැම දිනේ
දුගුණ ඇත්නම් ඒ හැම දුරලා
සුගුණ මතුකළ මැන මගේ
උපදින්නට පෙර සිටන්
මා කුස දරාගෙන ආදරෙන්
උතුම් කරුණා සිසිල දුන්නා
නුබගෙ කුස තුළ සිටියදීත්
කවා පොවමින් සවිය ඇත්තෙක්
කළේ අපමණ සෙනෙහසින්
එහෙත් ඔබ මට ඔවා දුන්නේ
උතුම් මිනිසෙක් වන ලෙසින්
කුසට අහරක් නැතත් ඔබ හට
රසින් මගෙ කුස පුරවමින්
එදා නුබ නිති කඳුලු සැලුවේ
මගෙ මුවට සිනහව දෙමින්
උතුම් කරුණා මෙත් උපෙක්ඛා
මෙමට පැලඳූ අනුහසින්
නිවන් දක්නට තවත් පිං කිම
බුදුබව ලැබේවා මිදෙමින් දුකින්
නොනිමි සසරේ රුදුරු කතරේ
මා සැරිසරනා හැම භවේ
මගේ මව වී මග කියනු මැන
නිවන් දක්නා තෙක් ලොවේ....

*සෙ/2088815 ආසෙ බංඩාර ජීජීජීඑස්ජී*
*20 ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව*
*යුහ කඳවුර - පෙරියවලයන්කඩ්ඩු*

## ගෙවි ගිය තාරුණ්‍යය

ළමා සිතුවිලි එළවා දමා
තාරුණ්‍යයේ සිතිවිලි
සිත තාරුණ්‍යයට
රැගෙන යන විට....
දුහුවිලි පිරුණු
ලිපිගොනු පොත්පත් අතර
තාරුණ්‍යය....
බුලට් දුම්රියේ වේගයෙන්
ගෙවී ගොස් ඇතිබව
නොදැනුනේ කෙලෙසකද?

*මේජර් කේඑන්එස් මෙන්ඩිස්*
*නීති නිලධාරී - ආරක්ෂක අමාත්‍යංශය*

## විනාශයක් ඇති කළ දේ රටට

| | |
|---|---|
| අපි පොඩිකාලේ ගමේ ඔක්කොම | එකතුවෙලා |
| පොල් අතු බැන්දෙ වහලට ගොක්අතු | තවලා |
| මගුලක් වුනොත් පුටු මේසද | එකතු කළා |
| පොත පත අරන් වීදුරු බඩු | එකතු කළා |
| වී ඇට ඇහිඳින්න ගල් කැට | ඇහිඳින්න |
| කළු ඇට ඇහිඳින්න ගේ හැඩකර | ගන්න |
| කුලියට ගත්තෙ නෑ ඒ වැඩ | කරගන්න |
| අද නෑ එවැනි දේ අපෙ ගම | දැකගන්න |
| කේටරින් සර්විස් කියා පිළිකාවක් ගම් | වැදිලා |
| ජංගම දුරකථනයෙන් මගුලද | කියලා |
| ඊසි කියන ක්‍රමයට කෑසුත් | එවලා |
| එකමුතුකමට අද කොඩිවිනයක් | කරලා |
| මට හරිදුකයි අපෙ රට වැනසී | යනවා |
| හොඳගති ටිකෙන් ටික මුදලට යට | වෙනවා |
| සර්විස් කේටරින් ස්කූටි ද | මේවා |
| සමගින් හෑන් ෆෝනය පිළිකුල් | වේවා |

*සෙ/104883 කෝප්‍රල් නයනජිත් කේඩබ්ලිව්*
*යුමාජේශා - යුහමු*

## කාලය

කාලය ගෙවී ගිය අරුමය
ගෙවීගිය සුන්දර ඒ අතීතයට
අයෙත් යන්න ඇත්නම්
පාසල් මිතුරු මිතුරියන් එක්ක
අඹ ගස් සෙවනට වී මොහොතක්
ඉන්නට ඇත්නම්
මේ හඩා වැළපෙන සිතට
සුවයක් දැනෙයි නිසැකවම
කාලය ගෙවීගිය අරුමය
දැනෙන විට නිතර නිතර
සත්තයි කඳුලු එනවා නෙතට
තාත්තගෙ තුරුලට වෙලා
සුව නින්දක් යන්නේ කවදාද
හරිහමන් නොතේරෙන ඒ කාලේ
හැමදේම තේරෙන
වර්ථමානයට වඩා
පුදුම තරම් සුන්දරයි
ජීවිතේ ලස්සනම කාලයයි....

*සෙ/කිප්‍1043364 සසෙ බංඩාර කේඑම්ඒච්*
*9 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව*
*යුහ කඳවුර - මුලතිව්*

## පොඩි සාදු වඩිනවා

කසාවත් පොරවා
හිස මුඩු කොට
සන්සුන් ගමනයි
මඳ සිනාවයි
සිත පහන් වෙනවා
පොඩි සාදු
පෙර මඟට වඩිනවා
පොල් අතු රටා මවනවා
කා සමඟත් සිනා සෙනා
පොඩි සාදුනේ ඔබ සසරින්
එතෙරට ගියදා
සාදුකාර හඬ ඇසුණා....

*ඩබ්ලිව් එස් ලියනගේ*
*13 බී - කලා*

## සිනහවද නුඹ විය

සිනහවද නුඹ විය
කඳුලද නුඹ විය
නොලැබුනද රතු පලස් මත යන්නට
නොලැබුනද හිස මත ඔටුණු පලඳින්නට
සත්තකින්ම විය නුඹ රජෙක්
රතු ලෙය කිරට හරවා පෙවූ මවකගේද
සුසුමින් ලෝකයම දවාහළු කරවා
නුඹ වෙනුවෙන්
දහඩිය බිඳු හෙළු පියකෙනෙකුටද
පුතෙකු විය නුඹ...
ස්නේහයේ ලපටි කොඳ කැකුළු
නුඹේ දෙපා පුදසුන මත
පූජා කරන ලද යසෝධරාවක් වන්
ගැහැණියකගේ
ආදරබර සැමියාද නුඹ විය...
නුඹේ ලෙයින් ජනිත වුන
දූ පුතුනට
ආදරබර පියානන්ද නුඹ විය...
මුලු ලොවම නිදනා මහ මැදියම
නෙත නුඹේ නැත පියවුනේ...
රැකුණේ නුඹ නිසයි අප සියල්ලෝම
එම නිසයි අප සැනසුණේ
එල්ලවුව මුත් නුඹ දෙසට
සියක් රුපු අවි එක ලෙසින්
නැත බියක් කිසි විටෙක දැනුනේ
නුඹයි පුතු වැදූ ලක් මෑණියන්

*එච්එච් දේවිකා ප්‍රියදර්ශනී යාපා (බිරිඳ)*
*මේජර් වයිඑච්එම් යාපා පීඑස්සී - යාපාරෙ*
*මාණ්ඩලික රාජකාරී අධ්‍යක්ෂ මණ්ඩලය - යුහමු*

# ලේ දන්දීමේ වැඩසටහනක්...



කිළිනොච්චි ආරක්‍ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ජීවී රවිප්‍රිය ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී එන්ඩීයූ අයිජී ගේ මඟපෙන්වීම මත කිළිනොච්චි මහ රෝහලේ ලේ බැංකුවේ වෛද්‍ය ධනුෂ්ක හිදගෙදර මහතාගේ ඉල්ලීමකට අනුව තෙලිප්පලෙයි රෝහලේ ප්‍රතිකාර ලබන පිළිකා



රෝගීන්ගේ අවශ්‍යතාවය වෙනුවෙන් රුධිර පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් 2019 ඔක්තෝබර් මස 26 වන දින පැවැත්විණ. කිළිනොච්චි මහ රෝහලේදී සිදුකෙරුණු මෙම ලේ දන්දීමේ වැඩසටහනට යුද හමුදාව සහ කිළිනොච්චි විශ්ව විද්‍යාලයේ ළමුන් එක්වූහ.





## රෙජිමේන්තු සංවත්සර දින අභිමානවත්ව සමරයි....

ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බළකායෙහි 29 වන රෙජිමේන්තු දින සංවත්සරයට සමගාමීව ඉකුත් සැප්තැම්බර් 27 දින වර්ණවත් සංගීත ප්‍රසංගයක් එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ. රෙජිමේන්තු බළකාධිපති හා හකාස අණසක මූලස්ථානයේ ආඥාපති මේජර් ජෙනරාල් ඩීකේජීඩී සිරිසේන යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් සියලු නිලයින්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලද මෙම ප්‍රසංගය සඳහා දිවයිනේ ප්‍රසිද්ධ සංගීත කණ්ඩායමක් වන "අප්ඩේට්" සංගීත කණ්ඩායම හා "ෂයින්" නර්තන කණ්ඩායම වාදනයෙන් හා නර්තනයෙන් දායක වූහ. එසේම ප්‍රසිද්ධ ගායක ගායිකාවන් රැසක්ද ඊට ගීත ගායනයෙන් එක්වූහ.

## සෙබලුන්ගේ දැනුමට හරවත් දේශනයක්....

57 සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් බීපීඑස් ද සිල්වා ආර්එස්පී ගේ මඟපෙන්වීම යටතේ 572 බළසේනාධිපති කර්නල් ඩීඑම්පීපී දසනායක ගේ සංවිධායකත්වයෙන් ඉකුත් නොවැම්බර් 11 දින මානව සම්පත් කළමණාකරණය පිළිබඳ දේශනයක් එම බළසේනා මූලස්ථාන දේශන ශාලාවේදී පවත්වන ලදී.

කොළඹ විශ්ව විද්‍යාලයේ කළමණාකරණ හා මූල්‍ය පීඨයේ ඩබ්ලිව් ජී ප්‍රේමරත්න මහතා විසින් මෙහෙයවූ එම දේශනයට 572 බළසේනාවට අයත් නිලධාරීන්, නිලධාරිනියන් සහ සෙසුනිලයින් විශාල පිරිසක් සහභාගි වූහ.



# අභිමානවත් සංවත්සර දිනය සමරමින්....





වසර 116 ක ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියන ස්වේච්ඡා බලසේනා පුහුණු පාසලේ නවතමයෙන් ඉදිකරන ලද මුර පිරික්සුම, බී පිවිසුම් දොරටුව, වැලි ආකෘති ශාලාව සහ සාකච්ඡා ශාලාව ශ්‍රීලංයුහසෙච්බමු නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් එල්එෆ් කස්තුරිආරච්චි කේඑස්වී ගේ සුරතින් ඉකුත් ඔක්තෝම්බර් 15 දින සුබ මොහොතින් විවෘත කරන ලදී.

එම අවස්ථාවට සමගාමීව පුහුණු පාසලට අයත් මුතුකුමරු ක්‍රීඩාංගනය නවීකරණය කිරීම සඳහා මුල්ගල තැබීමද පුහුණු පාසලෙහි සියලුම නිලධාරීන්ට සහ ජ්‍යෙකොනොනීන් හට සේවය ඇගයීමේ සහතික පත් ප්‍රදානය කිරීමද, පුහුණු පාසලේ ප්‍රයෝජනය සඳහා මල්ටිමීඩියා යන්ත්‍රයක් පරිත්‍යාග කිරීමද, පුස්තකාලය වෙත පොත්පත් පරිත්‍යාග කිරීමද සිදුවිය. ඉන් අනතුරුව එම පුහුණු පාසලෙහි රාජකාරී නියුතු සෙසුනිලයින් 58 දෙනෙකු සඳහා අරෙසෙ මත නිල උසස්කර අදාල නිල ලාංඡන පැලඳවීමද නියෝජ්‍ය සේනාවිධායක ගේ සුරතින් සිදුකෙරිණ.

## ලේ දන්දීමේ වැඩසටහනක්....



වන්නි ආරක්ෂක සේනා මූලස්ථානයේ රාජකාරී නියුතු යුද්ධ හමුදා සාමාජිකයින් 300 කට වැඩි පිරිසකගේ සහභාගීත්වයෙන් යුතුව ලේ දන්දීමේ වැඩසටහනක් ඉකුත් ඔක්තෝම්බර් මස 23 දින ආසේමු (වන්නි) ක්ෂේත්‍ර රෝහලේදී පැවත්වන ලදී. අනුරාධපුර, පොලොන්නරුව, මන්නාරම සහ වව්නියාව දිස්ත්‍රික්කයන්හි රෝහල්වල රෝගීන් සඳහා රුධිර හිඟතාවය හේතුවෙන් එම රෝහල් වෙතින් කරනු ලබන ඉල්ලීමකට අනුව එම වැඩසටහන ක්‍රියාත්මක කෙරිණ. වන්නි ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එච්ජේඑස් ගුණවර්ධන ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ මගපෙන්වීම මත එම සමාජ මෙහෙවර සිදුවිය. එදින 21 වන සේනාංකයේ රාජකාරී නියුතු යුද්ධ හමුදා සාමාජිකයින් 75 දෙනෙකුගේ සහභාගීත්වයෙන්ද අනුරාධපුර රෝහලේදී ලේ දන්දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කෙරිණ.

## ජන සවියට විරු සරණක්...



54 සේනාංකයේ සේනාංකාධිපති බ්‍රිගේඩියර් ඒජ්අයිජේ බංඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ අධීක්ෂණය යටතේ 542 බලසේනාවේ බලසේනාධිපති කර්නල් අයිඑච්එම්ආර් හේරත් යූඑස්පී පීඑස්සී ගේ සම්බන්ධීකරණයෙන් එම බලප්‍රදේශයේ නාරිකාඩු සහ කොන්ඩාච්චි යන ගම්මානවල අඩුආදායම්ලාභී පවුල් 50 ක් සඳහා වියළි ආහාර ද්‍රව්‍ය බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් සැප්තැම්බර් මස 20 දින දියත්කරන ලදී.

එම ප්‍රජා සත්කාරය සඳහා මාතලේ බෞද්ධ කාන්තා සංගමය මඟින් අනුග්‍රාහකත්වය ලබා දුන් අතර එම අවස්ථාවට 54 සේනාංකාධිපති, 542 බලසේනාධිපති, බෞද්ධ කාන්තා සංගමයේ සාමාජිකාවන් මෙන්ම ගම්වාසීන් රැසක්ද සහභාගි වූහ.




English Vision පාඩම් මාලාව ඔස්සේ Art of the Language (භාෂාවේ කලාව) අධ්‍යයන සඳහා 'රණවිරුවා' මාසික සඟරාව මගින් ඔබ හමුවට ගෙන එන තවත් එක් සරල ඉංග්‍රීසි වාක්‍ය රටාවක භාවිතය පිළිබඳව මෙම මස කලාපය තුළින් අවධානය යොමු කරමු.

## What About

යම්කිසි කාර්යයක් කිරීමට කෙනෙකුට ඉතා සුහදව ආරාධනය කිරීමේදී "එලෙස කරමු, කරානම් හොඳයි" යන අර්ථය සහිතව බහුලව වාචික බස්වහරෙහි භාවිතා වනු දැකිය හැක.

**Formula - සූත්‍රය**

What about + Verb(ing) + Object + Rest.

වට් අබවුට් + වර්බ් (අයිඑන්ජි) + ඔබ්ජෙක්ට් + රෙස්ට්

එලෙස කරමු. කරානම් හොඳයි + ක්‍රියාපදය (ing ස්වරූපය) + කර්මය + ඉතිරිය

Ex/උදා:-

1. What about going to the canteen?
   වට් අබවුට් ගොයින්ග් ටු ද කැන්ටීන්?
   කැන්ටීමට ගියා නම් මොකද?
2. What about you singing a song?
   වට් අබවුට් යූ සිගින් අ සෝන්ග්?
   ඔයා සින්දුවක් ගායනා කලා නම් මොකද?
3. What about playing cricket?
   වට් අබවුට් ප්ලෙයින්ග් ක්‍රිකට්?
   ක්‍රිකට් සෙල්ලම් කලා නම් මොකද?
4. What about swimming in the sea?
   වට් අබවුට් ස්විමින්ග් ඉන් ද සී?
   මූදේ පීනමුකෝ?

Noye Bene/සැ.යු :-

මෙම වාක්‍යය රටාව භාවිතා කිරීමේදී පහත උපදෙස් පිළිපැදීම වැදගත් වේ.

- What about
  'එලෙස කරමු, කරානම් හොඳයි' ආදී වශයෙන් අර්ථය ගැනීම සඳහා මෙම වාක්‍යය කණ්ඩය කිසිඳු වෙනසකින් තොරව වාක්‍යයෙහි භාවිතා කළ හැක.
- Verb(ing)
  ක්‍රියා පදය (සබට ස්වරූපය) පමණක් භාවිතා වේ.
- Object
  කර්ම පදය වශයෙන් කර්තෘ කරන ක්‍රියාවට භාජනය වන බලපෑම් ලබන පුද්ගලයකු හෝ පදයක් වේනම් එය කර්ම පදය ලෙස වාක්‍යයෙහි ඒකවචන, බහුවචන බේදයකින් තොරව භාවිතා වේ.
- Rest.
  ඉතිරිය වාක්‍යයෙහි කර්තෘ, ක්‍රියාව, කර්මය ආදී වශයෙන් පිළිවෙලින් යෙදී කාලය හඟවන පද වේ නම් ඒවා ඉතිරිය ලෙස වාක්‍යයෙහි අග භාවිතා වේ.

වාක්‍යය රටාවෙහි සැකැස්ම විශ්ලේෂණය

What about + Subject + Verb(ing) + Object + Rest.

වට් අබවුට් + සබ්ජෙක්ට් + වර්බ් (අයිඑන්ජි) + ඔබ්ජෙක්ට් + රෙස්ට්

එලෙස කරමු. කරානම් හොඳයි + කර්තෘ + ක්‍රියාපදය (ing ස්වරූපය) + කර්මය + ඉතිරිය

What about going to the canteen?
වට් අබවුට් ගොයින්ග් ටු ද කැන්ටීන්?
කැන්ටීමට ගියා නම් මොකද/යමුකෝ?

English Vision නව පාඩම් මාලාවක් ඔස්සේ ඔබගේ ඉංග්‍රීසි

භාෂා දැනුම වර්ධනය සඳහා 'රණවිරුවා' මීළඟ කලාපය සමග එක්වන්න. තවද ඔබට මගහැරුණු පාඩම් අධ්‍යයන කිරීම සඳහා පහත දී ඇති වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.

**English Vision**
Join The Best To Be The Very Best…
Aviation of new culture in studding English & the art of language, we designed.
English Instructor – Captain Chaminda Liyanage SLAGSC
Info – Tp 0719200733 Web : www.englishvision.lk Email : milangaliyanage@gmail.com
Fb Page : English Vision Art of The Language

කපිතාන් චමින්ද ලියනගේ
ශ්‍රීලයුසොදසේබ
සංඥා පුහුණු පාසල - බුවැලිකඩ
www.englishvision.lk






## පවුලට ලංවීම

**සුමිත්** - මගෙ කෙල්ල කිව්වා එයාගෙ පවුලෙ අයට මීට වඩා ලංවෙන්න කියල...

**සිරිමල්** - ඉතින් උඹ මොකද කිව්වෙ...

**සුමිත්** - මම කෙල්ලගෙ නංගිගෙ නුත් යාළුවෙන්ඩ ඇහුව... නංගි කිව්ව අම්මගෙන් අහල උත්තරයක් දෙන්නම් කියල...



## රින්ග් එක

**ඈන්** - බබා... මේ අහන්නකො...

**චමත්** - ඔව් සුදූ...කියන්නො...

**ඈන්** - අපි දෙන්න යාළුවෙලා හෙටට අවුරුද්දක් නේද?

**චමත්** - ආ... ඔව්ම තමයි...

**ඈන්** - ඉතින් ඔයා ඒ වෙනුවෙන් මොනවද දෙන්නෙ?

**චමත්** - ඔයාට මොනවද ඕන?

**ඈන්** - රින්ග් එකක්...

**චමත්** - රින්ග් එකක් දෙන්නම්. හැබැයි ෆොන් එක උස්සන්ඩ එපා...



## පේර ගහ

**අම්මා** - උඹ බීල නේද ඉන්නෙ?

**කසුන්** - පිස්සුද අම්මෙ... මං බිව්වෙ නෑ...

**අම්මා** - උඹ බීල ගෙදර ආවට කමක් නෑ... එන ගමන් පේර ගහේ කොළ කන එක නවත්තපං... උඹ හැදෙන්නෙ නැත්තං ඒ ගහට හරි හැදෙන්න දීපං...

## රිය පැදවීම

**මයික්** - මචං... බීල වාහන එලවන එක අනතුරුදායක හින්ද මම ඊයෙ කාර් එක බාර්එක ලග දාල බස් එකේ ගෙදර ආව...

**ජැක්සන්** - හම්මට... අන්න මිනිස්සු... උඹ මාර ඩයල් එකක්නෙ බං... අහන්නත් සංතෝශයි බං ඒ ගැන...

**මයික්** - මටත් මං ගැන ආඩම්බරයි බං... මං ජීවිතේට මීටකලින් බස් එකක් එලවල තිබ්බෙ නෑ... සිරාවටම...

## ඉංග්‍රීසි කියවීම

**ටීනා** - මේ... අපේ චුට්ටි පුතා දැන් 2 වසරෙනෙ... ඒ උනාට මාර ඉක්මනට ඉංග්‍රීසි කියාගෙන කියාගෙන යනවනෙ ඒයි... අහන් ඉන්නත් ආසයි...

**රෝසි** - ආනේ...ඇත්තද? විශ්වාස කරන්නත් බෑ අනේ...

**ටීනා** - පුතේ... කියන්නකො මේ ඇන්ටිටත් ඇහෙන්න...

**පුතා** -

ඉංග්‍රීසි...ඉංග්‍රීසි...ඉංග්‍රීසි...

ඉංග්‍රීසි...ඉංග්‍රීසි...ඉංග්‍රීසි...

**ටීනා** - ඇහුනද ඔයාට?

**රෝසි** - ඇහුන... ඇහුන..




## ගණන් හැදීම

**ටීචර්** - නයනි... කියන්න බලන්ඩ 4 X 3 කීයද කියල?

**නයනි** - 12 යි ටීචර්...

**ටීචර්** - එතකොට නයනි 3 X 4 කීයද?

**නයනි** - අනේ ටීචර්... අංක දෙක මාරු කරල ඒ ප්‍රශනෙම අහනව නේද?

**ටීචර්** - ළමය... මං අහපු එකට උත්තරේ කියන්න...

**නයනි** - අයියෝ ටීචර්... ඕක ලේසියිනෙ... 12 හේ ඉලක්කම් දෙක මාරු කරාම හරිනෙ ටීචර්...



ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) ආඥාපති ලෙස

**මේජර් ජෙනරාල් ඒඑම්ආර් ධර්මසිරි එන්ඩියූ පීඑස්සී**

2019 නොවැම්බර් මස 21 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



ප්‍රධාන මාණ්ඩලික ශාඛාවේ අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික ලෙස

**මේජර් ජෙනරාල් ටීඑස් බන්සජායා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූ**

2019 නොවැම්බර් මස 20 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



22 සේනාංකයේ සේනාංකාධිපති ලෙස

**මේජර් ජෙනරාල් ඒඅයි මාරසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**

2019 නොවැම්බර් මස 04 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



24 සේනාංකයේ සේනාංකාධිපති ලෙස

**බ්‍රිගේඩියර් ජේසී ගමගේ එන්ඩීසී පීඑස්සී**

2019 නොවැම්බර් මස 01 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



56 සේනාංකයේ සේනාංකාධිපති ලෙස

**බ්‍රිගේඩියර් ඩබ්ලිව්එම්ජේආර්කේ සේනාරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**

2019 ඔක්තෝම්බර් මස 22 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



පුහුණු අධ්‍යක්ෂක මණ්ඩලයේ අධ්‍යක්ෂ ලෙස

**බ්‍රිගේඩියර් අයිඑම්එන්එන් හේරත් ආර්එස්පී යූඑස්පී**

2019 නොවැම්බර් මස 11 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) බ්‍රිගේඩියර් ප්‍රමා ලෙස

**බ්‍රිගේඩියර් ආර්ඒඩීපී රණවක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී**

2019 ඔක්තෝම්බර් මස 31 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



අයවැය හා මුදල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලයේ කෘනි අධක්‍ෂ ලෙස

**කර්නල් එම්ඩබ්ලිව්ටීසී මෙත්තානන්ද යූඑස්පී**

2019 ඔක්තෝම්බර් මස 31 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



515 බලසේනාවේ බලසේනාධිපති ලෙස

**බ්‍රිගේඩියර් ඒඑස් වික්‍රමසේන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී**

2019 ඔක්තෝම්බර් මස 30 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



522 බලසේනාවේ බලසේනාධිපති ලෙස

**කර්නල් ඊකේඩබ්ලිව්ජේ විජයසිරි ආර්එස්පී**

2019 ඔක්තෝම්බර් මස 31 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



111 බලසේනාවේ බලසේනාධිපති ලෙස

**කර්නල් කේඒඩබ්ලිව්එන්එච් බණ්ඩාරනායක යූඑස්පී**

2019 සැප්තැම්බර් මස 23 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



661 බලසේනාවේ බලසේනාධිපති ලෙස

**කර්නල් එච්එච්කේඑස්එස් හේවගේ**

2019 නොවැම්බර් මස 18 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



574 වන බළසේනාවේ බළසේනාධිපති ලෙස

**කර්නල් විඩීඑස් පෙරේරා**

2019 නොවැම්බර් මස 12 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



4 වන ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බළකායේ අණදෙන නිලධාරී ලෙස

**ලුතිනන් කර්නල් ඩීඒඅයිජේ දළුගම යූඑස්පී පීඑස්සී**

2019 නොවැම්බර් මස 11 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



7 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බළකායේ අණදෙන නිලධාරී ලෙස

**මේජර් එස්පී කස්තුරිආරච්චි**

2019 අගෝස්තු මස 20 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



7 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බළකායේ අණදෙන නිලධාරී ලෙස

**මේජර් ජේආර්පීකේ ගල්හේන**

2019 ඔක්තෝම්බර් මස 17 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු





පස්වන වියට පා තබන
**ගනුත කල්මිර පුතුට (වම)**
සහ
දෙවන වියට පා තබන
**වෙනිත ටත්මිර පුතුට (දකුණ)**
සුබ උපන් දිනයකට ආසිරි පතන්නේ
අම්මා හා තාත්තා ඇතුලු පවුලේ සැම
(මේජර් නදීක හේවාවසම්)



අටවන වියට පා තබන

**ටීජී ගිම්හාන් සත්සර කරුණාරත්න පුතුට**

සුබ උපන් දිනයකට ආසිරි පතන්නේ අම්මා හා තාත්තා ඇතුලු පවුලේ සැම (සෙ/367637 ලා/කෝ කරුණාරත්න ජීටීජීසී )



සිව්වන වසරට පා තබන

**ටීඩබ්ලිව්ජී මනුකි විහංසා මෙත්සානි දියණියට**

සුබ උපන් දිනයකට ආසිරි පතන්නේ අම්මා හා තාත්තා ඇතුලු පවුලේ සැම (සෙ/483376 කෝප්‍රල් මදුසංක ටීඩබ්ලිව්ජීඒ)



පළමු වසරට පා තබන

**භාග්‍යා උදාරි කරුණාරත්න දියණියට**

සුබ උපන් දිනයකට ආසිරි පතන්නේ අම්මා හා තාත්තා ඇතුලු පවුලේ සැම (සෙ/519394 ව/සැරයන් කරුණාරත්න ඊසීජී)



පස්වන වසරට පා තබන

**දෙව්මි සහස්‍යා දියණියට**

සුබ උපන් දිනයකට ආසිරි පතන්නේ අම්මා හා තාත්තා ඇතුලු පවුලේ සැම (සෙ/371938 ලා/කෝප්‍රල් සුරේෂ් කුමාර ඩබ්ලිව්ජී)

# සමුගත් විරුවාට බුහුමන්





හදිසියේ අභාවප්ප්‍රාප්ත වූ විජයබාහු පාබල රෙජිමේන්තුවට අයත් නිලධාරියෙකු වූ ලුතිනන් කර්නල් එච්එල්සී බැස්ටියන් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ අවමංගල්‍ය උත්සවය ඉකුත් නොවැම්බර් 25 දින ගාල්ල දඩැල්ල පොදු සුසාන භූමියේ දී සිදුකෙරිණ. යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ද එම අවස්ථාවට සහභාගි වෙමින් එම රණවිරුවාට සිය අවසන් ගෞරවාචාරය පුදකළ අතර, එහිදී එම පවුලේ ඥාතීන් වෙත හෙතෙම සිය ශෝකය පළකර සිටියේය.


## රණවිරුවා

**පරිගණක අකුරු සංයෝජනය,**
**කවර නිර්මාණය හා පිටු සැකසුම**

සෙ/752158 සැරයන් සේනාරත්න ජීසී - 3 ඉසේරෙ
සෙ/753797 ලාන්ස් කෝප්‍රල් කුමාරසිංහ එම්ජීජ්එම් - 11 ඉසේරෙ
සෙ/2081045 ඉසෙ ලක්තිළිණ ඩබ්ලිව්ආර් - 11 ඉසේරෙ

**රණවිරුවා ලිපිනය**

රණවිරුවා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය,
ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ.

**ඊමේල්**

dtepsyops@army.lk
ranaviruwa@yahoo.com

**දුරකථන**

011 2993076

**යුහ දිගුව**

51445/51446

**ප්‍රකාශනය**

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය







**අධීක්ෂණය**

බ්‍රිගේඩියර් ආර්එම්පීජේ රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී



**උපදේශකත්වය**

ලුතිනන් කර්නල් එස්ජේ කාරියකරවන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී - විපාරෙ



**ප්‍රධාන සංස්කාරක**

මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ ශ්‍රීලයුපොදුසේබ



**සහාය සංස්කාරක**

කපිතාන් ආර්ඩී හේවාවිතාරණ - ශ්‍රීලයුකාබ



**සෝදුපත් කියවීම**

කපිතාන් ඩීඑම් දිල්හාරා සජීවනී - ජාශිබ

# උතුම් දිවි පුදකළ විරුවන් සැමරේ...









මාතෘභූමියේ ස්වෛරීභාවය සහ භෞමික අඛණ්ඩතාවය ආරක්ෂා කිරීම වෙනුවෙන් තම දිවි පුදකළ ශ්‍රී ලංකා පාබල හමුදා විරුවන් 3878 දෙනෙකු සැමරීමේ අභිමානවත් උත්සවයක් ඉකුත් ඔක්තෝම්බර් 25 දින එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ. පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එල්එම් මුදලිගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ ආරාධනයෙන් එම රෙජිමේන්තුවේ කීර්තිමත් නිලධාරියෙකු වූ ආරක්ෂක ලේකම් ජෙනරාල් (විශ්‍රාමික) ශාන්ත කෝට්ටේගොඩ සහ යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සීද මෙම අවස්ථාවට ප්‍රධාන අමුත්තන් ලෙස එක්වූහ.

දිවි පිදූ වීරෝදාර රණවිරුවන්ගේ ඥාතීන් සහ ආරාධිතයින් රැසකගේ සහභාගීත්වයෙන් "අබිමන් මුදුනත" පාබල හමුදා රණවිරු ස්මාරකය අභියස පැවති මෙම සැමරුම් උත්සවය අතිශය හැගුම්බර ගෞරවනීය එකක් විය.


රණවිරුවා
2019 නොවැම්බර් • 211 කලාපය








## ලද දෙයින් උපරිමය....



අවධානම හා දුෂ්කරතාවය කියන්නෙ යුද බිම තුළ සාමාන්‍ය දෙයක්. යුද්ධ භූමියේදී හොඳ දේවල් හරි විධියට හැම තැනදීම ලැබෙන්නෙ නැහැ. එහිදී කිසිදෙයක් තෝර තෝර ඉන්න බැහැ. එහෙම තෝරන්න පුළුවන් එකම දේ ජීවිතය විතරමයි. ඒ සියල්ල අතරෙත් සෙබළෙකුගෙ පිළිවෙල පිරිසිදුකම හැමදාම තිබුණා. ඒකට තැන අවස්ථාව අදාළ වුණේ නෑ. සුලුවෙන් ලැබෙන දෙයකින් උනත් උපරිමයෙන් ප්‍රයෝජන ගන්න හැටි අපේ සෙබළු දැනගෙන හිටියා. අවසන් මානුෂීය මෙහෙයුමේ සාර්ථකත්වය පසුපස මේ වගේ අප්‍රකට හේතු ගොන්නක් ගැබ්වෙලා තිබුණා.

මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ.